ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල
මාර්ගෝපදේශ මාලාව

අංක : 2









# හොඳ පෙනුමක්

## සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා කාර්මික සැලසුම් ආරක්ෂණය පිළිබඳ හැඳින්වීමක්

WIPO
WORLD
INTELLECTUAL PROPERTY
ORGANIZATION

# හැඳින්වීම

බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල නම් වූ මාර්ගෝපදේශන මාලාවේ දෙවැන්න ලෙස මෙම පොත් පිංච එළි දකී. මෙමගින් භාණ්ඩ වල "කාර්මික සැලසුම්" පිළිබඳව අවධානය යොමු කෙරේ. කාර්මික සැලසුම භාණ්ඩයක වෙළඳපල සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රධාන අංගයකි. බුද්ධිමය දේපල පිළිබඳ නීතිය යටතේ කාර්මික සැලසුම්, භාණ්ඩයක බාහිර පෙනුම හා කලාත්මක බව හා බැඳුනු සංකල්පයකි. මෙමගින් භාණ්ඩය කෙරෙහි පාරිභෝගිකයන් ආකර්පණය කර ගැනීම සිදුවන අතර වෙළඳපලෙහි අනිකුත් තරඟකාරි භාණ්ඩ අභිබවා පාරිභෝගිකයන්ගේ තේරීම බවට භාණ්ඩය පත්වීමට හේතු වේ. කාර්මික සැලසුම් මගින් ආයතනයකට තම භාණ්ඩය තරඟකාරි භාණ්ඩ වලින් වෙන් කර දැක්වීමට ද වෙළඳ පල තුල ප්‍රබල ප්‍රතිරූපයක් ස්ථාපනය කර ගැනීමටද උපකාරි වේ. මේනිසාම කාර්මික සැලසුම ආරක්පණය කර ගැනීම ආයතනයකට ඉතාම වැදගත් වේ.

මෙම මාර්ගෝපදේශන මාලාව මගින් බලාපොරොත්තු වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් කාර්මික සැලසුම් ආරක්පණය පිළිබඳව දැනුවත් කිරීමයි. මේ පිළිබඳව ඇතිවන ගැටළු සහගත තත්වයන් ඒවාට විසඳුම් ආදිය උදාහරණ, චිත්‍ර හා රූප භාවිතා කරමින් විස්තර කර ඇත.

විවිධ රටවල පවතින බුද්ධිමය දේපල පිළිබඳ ආයතන සමඟ සහයෝගයෙන් ඒ ඒ රටවලට ගැලපෙන ආකාරයට මෙම මාර්ගෝපදේශනය දියුණු කල හැකිය. ඒ පිළිබඳව බුද්ධිමය දේපල සඳහා වන ලෝක සංවිධානය සමඟ සම්බන්ධ වී ආදාල මාර්ගෝපදේශ හා උපදෙස් ලබා ගත හැකිය.

## ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල මාර්ගෝපදේශ මාලාව

1. "ඔබටත් ලකුණක්" - වෙළඳ ලකුණු ආරක්ෂණය: සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා වෙළඳ ලකුණු පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 900 වැනි ප්‍රකාශනය)

2. "හොඳ පෙනුමක්" - කාර්මික සැලසුම් ආරක්ෂණය: සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා කාර්මික සැලසුම් පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 498 වැනි ප්‍රකාශනය)

3. "සුරක්ෂිත අනාගතයක්" - පේටන්ට් ආරක්ෂණය: සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා පේටන්ට් බලපත්‍ර පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 917 වැනි ප්‍රකාශනය)

4. "නිර්මාණශීලී ඔබට ප්‍රතිරූපන ආරක්ෂණය": සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් සඳහා ප්‍රතිරූපන අයිතිය පිළිබඳ හැඳින්වීමක්. (බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය - 918 වැනි ප්‍රකාශනය)

ඉහත සියළු ප්‍රකාශන පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබා ගත හැක:
*www.wipo.int/ebookshop*

**වියාචනය:** මෙම පොතෙහි අඩංගු තොරතුරු වෘත්තීය නීති උපදෙස් සඳහා ආදේශකයක් නොවන බව සැලකිය යුතුය. මෙහි අඩංගු වන්නේ විෂයය පිළිබඳ මූලික තොරතුරු පමණි.

මෙම ප්‍රකාශනය බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානයේ (WIPO) පූර්ව අනුමැතිය සහිතව පරිවර්තනය කර ප්‍රතිසම්පාදනය කරන ලදී. මෙහි මුල් ඉංග්‍රීසි අනුවාදයේ ප්‍රතිරූපන අයිතිය බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) සතු වන අතර එම ප්‍රකාශනය www.wipo.int/sme/en/documents/guides/ වෙබ් අඩවියෙහි දක්වා ඇත. පරිවර්තනය කරන ලද පොතෙහි අඩංගු තොරතුරු වල නිවරැදි භාවය පිළිබඳව පූර්ණ වගකීම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය (Project SMED) සතු වන අතර ඒ පිළිබඳව බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානයේ වගකීමක් නොමැති බව සැලකිය යුතුය.

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය (ප්‍රතිරූපන අයිතිය 2010) ඉංග්‍රීසි අනුවාදයේ ප්‍රතිරූපන අයිතිය බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) (ප්‍රතිරූපන අයිතිය 2006)
මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් හෝ විද්‍යුත් මඟින් හෝ යාන්ත්‍රික මාර්ගයකින් හෝ වෙනත් කිසිම අයුරකින් ප්‍රතිසම්පාදනය කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ බෙදා හැරීම හිමි සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතියේ (Project SMED) පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුය.

www.wipo.int/sme/

## පටුන

පිටු අංක


1. කාර්මික සැලසුම් 3

2. කාර්මික සැලසුම් ආරක්ෂණය 6

3. විදේශීය රටකදී කාර්මික සැලසුම් ආරක්ෂණය 16

4. කාර්මික සැලසුම් බලාත්මක කිරීම 18

5. කාර්මික සැලසුම් ආරක්ෂණය පිළිබඳ වෙනත් නීතිමය මෙවලම් 19

# 1 කාර්මික සැලසුම්

## කාර්මික සැලසුමක් යනු කුමක්ද?

සාමාන්‍ය ව්‍යවහාරයේදී කාර්මික සැලසුමක් යනු භාණ්ඩයක සමස්ථ බාහිර ස්වභාවය හා එහි ක්‍රියාකාරිත්වයයි. උදාහරණයක් ලෙස අත් පුටුවක්. භාවිතා කරන්නාට සුව පහසුව සපයන්නේ නම් හා එහි පෙනුම සිත් ගන්නා සුළු ලෙස නිමවා ඇත්නම් එය මනා කාර්මික සැලසුමක් සහිත භාණ්ඩයක් ලෙස හැඳින්විය හැකිය. භාණ්ඩ නිෂ්පාදනයේදී අලෙවිකරණ හැකියාව, නිෂ්පාදන පිරිවැය, ප්‍රවාහනයේ හා ගබඩාකරණයේ පහසුව, අළුත්වැඩියා කිරීමේ හැකියාව භාවිතයෙන් පසු ඉවත දැමීමේ පහසුව ආදිය සැලකිල්ලට ගෙන එහි බාහිර පෙනුම හා ක්‍රියාකාරිත්වය සැලසුම් කිරීම කාර්මික සැලසුම පිළිබඳව මූලික හා වැදගත් කරුණු වේ.

බුද්ධිමය දේපල පිළිබඳ නීතිමය රාමුව තුල කාර්මික සැලසුම භාණ්ඩයේ බාහිර අලංකාරය හා සෞන්දර්යාත්මකභාවය පිළිබඳ පැතිකඩ පිළිබඳව අවධානය යොමු කරයි. ඉහත උදාහරණය සලකා බැලීමේදී අත් පුටුවක බාහිර පෙනුම මීට අදාළ වේ. භාණ්ඩයක් පිරිසැලසුම් කිරීමේදී එහි ශිල්පීය අංශය මෙන්ම ක්‍රියාකාරිත්වය පිළිබඳ ලක්පණ සලකා බැලුවද කාර්මික සැලසුමකදී පැහැදිලිවම සලකා බලනුයේ භාණ්ඩයේ බාහිර පෙනුම හා සෞන්දර්යාත්මක ස්වභාවයයි.

නවීන කර්මාන්ත ක්ෂේත්‍රයන්හි එනම් විලාසිතා, අත්කම්, කාර්මික උපකරණ, අත් ඔරලෝස, ආභරණ, අධිසුඛෝපභෝගි භාණ්ඩ, ගෘහ උපකරණ, ගෘහ සැලසුම් හා මෝටර් රථ වැනි අති මහත් වූ භාණ්ඩ පරාසයක් තුල කාර්මික සැලසුම් වල උපයෝගිතාවය දැකිය හැකිය. මීට අමතරව සමහර භාණ්ඩවල ඇසුරුමද කාර්මික සැලසුමේ එක් අංගයක් ලෙස දක්වා තිබේ. පොදු පිළිගැනීම අනුව කාර්මික සැලසුමක් ලක්‍ෂණ අනුව වර්ග තුනකට බෙදා දැක්විය හැකිය.

- ත්‍රිමාණ හැඩ තල සහිත (භාණ්ඩයක හැඩය වැනි)
- ද්විමාන හැඩ තල සහිත (එනම් බාහිර අලංකාරය. මෝස්තරය. රේඛා හා භාණ්ඩයක වර්ණය වැනි)
- ඉහත ලක්‍ෂණ දෙකෙහි සංකලනයෙන් බිහිවන හැඩතල සහිත.

**ත්‍රිමාණ හැඩ තල සහිත සැලසුම**



අනුග්‍රහය: විලරෝයි + බොච් ඒ.ජී.

**ද්විමාන හැඩ තල සහිත සැලසුම**



## ව්‍යාපාර වල නිර්මාණාත්මක සැලසුම්

ව්‍යාපාරිකයෝ තම භාණ්ඩවල සැලසුම් වර්ධනය කර ගැනීමට විශාල පරිශ්‍රමයක් හා සම්පත් ප්‍රමාණයක් යොදවති. ඒ අනුව ඔවුන් තම භාණ්ඩවලට නවෝත්පාදන හඳුන්වා දීමෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු කිහිපයකි.


1 **විශේෂ වෙළඳපල කොටස් ආකර්ෂණය කර ගැනීමට එම වෙළඳපලේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවලට අනුව භාණ්ඩය ඉදිරිපත් කිරීම:** භාණ්ඩයේ සැලසුමට ඉතා සුළු වෙනස්කම් හඳුන්වා දීම මෙහිදී සිදුවේ. (උදා අත් ඔරලෝසු) මෙහිදී භාණ්ඩයේ මූලික ක්‍රියාකාරිත්වයට බල නොපාන සේ විවිධ වයස් මට්ටම්වලට, සංස්කෘතික වටිනාකම් වලට මෙන්ම සමාජ ස්ථරවලට ගැලපෙන සේ බාහිරපෙනුම වෙනස් කර වෙළඳපලේ විවිධ පාරිභෝගික කණ්ඩායම් භාණ්ඩය වෙත ආකර්ෂණය කර ගත හැකිය.

2 **කුඩා වෙළඳපල අවකාශයක් නිර්මාණය කර ගැනීම:** තරඟකාරි වෙළඳපල තුළ තම භාණ්ඩයට විශේෂිත නිර්මාණාත්මක ලක්ෂණ එකතු කිරීම මගින් කුඩා වුවත් ඉහල ලාභ දායකත්වයකින් යුත් වෙළඳපලක් නිර්මාණය කර ගැනීම සමහර වෙළඳ ආයතනවල අරමුණ වේ. වෙළඳපල තුළ පවතින අන් භාණ්ඩ වලින් වෙනස්වන ලක්ෂණ සහිත භාණ්ඩයන් ඉදිරිපත් කිරීම මගින් හඳුනාගත් පාරිභෝගික කොට්ඨාශයක් ආකර්ශනය කර ගැනීම මෙහි අරමුණ වේ. වෙළඳපලේ පවතින යතුරු තහඩ, සපත්ත, කෝප්ප හා පීරිසි වැනි සාමාන්‍ය භාණ්ඩ වලට මෙන්ම ස්වර්ණාභරණ, පරිගණක හා මෝටර් රථ වැනි මිළ අධික භාණ්ඩ වලටද නිර්මාණාත්මක ලක්ෂණ එකතු කිරීම මගින් ලාභදායි වෙළඳපලක් ඇති කරගත හැකිය.

3 **වෙළඳ නාමයට වෙළඳපල තුළ ස්ථාවරත්වයක් ගොඩ නගා ගැනීම:** සමහර නිර්මාණාත්මක ලක්ෂණ භාණ්ඩයේ වෙළඳනාමය සමග අන්‍යෝන්‍යය ලෙස බැඳී පවති. වෙළඳනාමයට වෙළඳපලෙහි විශේෂිත ප්‍රතිරූපයක් හිමිකර දීමට නිර්මාණත්මක ලක්ෂණ බෙහෙවින් උපකාරිවේ.

## කාර්මික සැලසුම් ආරක්ෂාකර ගත යුත්තේ ඇයි?

කාර්මික සැලසුමක් ඕනෑම භාණ්ඩයකට සිත් ඇද ගන්නා සුළු ආකර්ෂනීය පෙනුමක් එක් කරන නිසා එමගින් භාණ්ඩයට අතිරේක වටිනාකමක් එකතු කෙරේ. කාර්මික සැලසුම භාණ්ඩයේ අද්විතීය විකුණුම් ලක්ෂණය (unique selling point) බවට පත්කර ගත හැකිය. ඒනිසා තමන් විසින් වැඩි දියුණු කරන ලද කාර්මික සැලසුම ආරක්ෂා කර ගැනීම ඕනෑම නිෂ්පාදකයෙකුට හෝ නිර්මාණකරුවෙකුට ඉතාම වැදගත් වේ.




අනුග්‍රහය: වික්ටෝරිනොක්ස් සමාගම

කාර්මික සැලසුම් ජාතික මට්ටමේ හෝ කලාපීය මට්ටමේ බුද්ධිමය දේපල පාලන අධිකාරියක ලියාපදිංචි කිරීම මගින් තම කාර්මික සැලසුම සඳහා පරම අයිතියක් (exclusive right) හිමි කරගැනීමට හිමිකරුට හැකිවේ. එමගින් දෙවන පාර්ශවයක් මගින් නීති විරෝධි ලෙස පිටපත් කිරීම හෝ අනුකරණය කිරීම වලක්වා ගත හැකි අතර ව්‍යාපාරයේ භාණ්ඩ වල වෙළඳපල තරඟකාරිත්වය වර්ධනය වීමෙන් අමතර වාසි රැසක් හිමි කර ගැනීමට නීත්‍යානුකුල හිමිකරුට හැකි වේ.

- කාර්මික සැලසුම ලියාපදිංචි කර ආරක්ෂණය කිරීම තුළින් නීති විරෝධී ලෙස පිටපත් කිරීම හෝ අනුකරණය කිරීම වළක්වා ගත හැකිය. එයින් භාණ්ඩයේ තරඟකාරීත්වය ඉහළ යයි.
- සැලසුම් ලියාපදිංචි කිරීම මගින් ඒ සඳහා කළ **ආයෝජනට සාධාරණ ප්‍රතිලාභයක්** ලබා ගැනීමටත් එමගින් ව්‍යාපාරයේ ලාභදායිත්වය ඉහළ නංවා ගැනීමටත් හැකිවේ.
- කාර්මික සැලසුමක් යනු **ව්‍යාපාරයේ වත්කමකි.** එමගින් ව්‍යාපාරයේ හා භාණ්ඩයේ වාණිජමය වටිනාකම ඉහළ යයි. කාර්මික සැලසුමේ සාර්ථකත්වය අනුව ව්‍යාපාරයේ වටිනාකම ද තීරණය වේ.
- ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුමක හිමිකම අන්සතු කිරීමට හා විකිණීමේ අවසරය **බලපත්‍රයක්** මගින් දෙවන පාර්ශවයකට ලබා දීම මගින් අමතර ආදායමක් උපයා ගැනීමටද හැකිවේ. බලපත්‍රයක් මගින් පවරා දීමෙන් අළුත් වෙළඳපළකට පිවිසීමට හැකියාවක් ලැබේ.
- කර්මාන්ත ක්ෂේත්‍ර තුළ සාධාරණ තරඟකාරීත්වයක් ඇති කර ගැනීමට ද අව්‍යාජ වෙළඳ පරිචයන් වැඩි දියුණු කර ගැනීමට ද කාර්මික සැලසුම් ලියාපදිංචිය හේතුවේ. එයින් ඇතිවන යහපත් තරඟකාරී ව්‍යාපාර පරිසරය තුළ මනා සෞන්දර්යාත්මක හා විවිධාංගීකරණයෙන් යුත් ආකර්ෂණීය භාණ්ඩ බිහිවීමේ අවකාශය පළුල් වේ.

**යුරෝපා සංගමය තුළ සැලසුම් ආරක්ෂණය කිරීම සම්බන්ධයෙන් බලපාන කරුණු -වැදගත්කමේ අනුපිළිවෙලට**




ප්‍රභවය: OHIM යුරෝපා සංගමය තුළ සැලසුම් ලියාපදිංචිය සඳහා ඇති ඉල්ලුම පිළිබඳ අධ්‍යයනය

## පිරිසැලසුමට ආලෝකයක්

විදුලි ලාම්පුවක ක්‍රියාකාරීත්වය භාණ්ඩයෙන් භාණ්ඩයට සැලකිය යුතු ලෙස වෙනස් නොවුණත් විදුලි ලාම්පුවක අලෙවිකරණය සාර්ථකත්වයට බලපාන සාධකය වන්නේ බාහිර පෙනුමයි. විවිධාකාර කාර්මික සැලසුම් වලට අනුව නිර්මාණය වූ ගෘහ විදුලි ලාම්පු වැනි භාණ්ඩ ලියාපදිංචිය සඳහා නිෂ්පාදකයින් උනන්දු වන්නේ තරගකාර වෙළඳපළ තුළ තම භාණ්ඩය කෙරෙහි පාරිභෝගිකයින් වැඩි සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීම පිණිසය.



අනුග්‍රහය: නෙමෝ එස්.පී.ඒ

## 2. කාර්මික සැලසුම් ආරක්ෂණය

### ඔබගේ කාර්මික සැලසුම් ආරක්ෂණය කළ හැක්කේ කෙසේද?

කාර්මික සැලසුම් ආරක්ෂණ නීතිය යටතේ ලියාපදිංචි කිරීමෙන් කාර්මික සැලසුම් ආරක්ෂණය කර ගැනීමේ අවස්ථාව ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබේ.

ලියාපදිංචි කිරීමට අවශ්‍ය කාර්මික සැලසුම සඳහා අයදුම්පත්‍රයක් අදාල රටේ **ජාතික බුද්ධිමය දේපල පාලනාධිකාරිය** වෙත ඉදිරිපත් කළ යුතුය. (මේ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වෙබ් අඩවි පිළිබඳ විස්තර ඇමුණුම් අංක Iහි අඩංගු වේ.) විදේශ රටකදී නීතිමය ආවරණය ලබා ගැනීම පිළිබඳ තොරතුරු 3 වන කාණ්ඩයෙහි අඩංගුවේ.

සමහර රටවල හා යුරෝපා සංගමය වැනි පොදු ආර්ථික කලාප සඳහා මෙතෙක් **ලියාපදිංචි කර නොමැති කාර්මික සැලසුම්** වලට වසර 3 ක සීමිත ආරක්ෂණයක් ලබා ගැනීමේ හැකියාව මෑතදී හඳුන්වා දුන් නීති මගින් ලබාදී ඇත. වසර 3 ක් යනු අදාල සැලසුම ප්‍රසිද්ධියට පත් කළ දින සිට වසර 3 කි.

වෙළඳපලට භාණ්ඩයක් හඳුන්වා දුන් වහාම ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කිරීම අවදානම් සහිතය. ඊට හේතුව සැලසුම ලියාපදිංචි කිරීම සඳහා මුදල් හා කාලය යෙදවීමෙන් පසුවත් භාණ්ඩය වෙළඳපලේ අසාර්ථකවීමේ හැකියාවක් පැවතීමයි. විලාසිතා වැනි ඉතා සුළු කාලයකින් යල් පනින භාණ්ඩ සඳහා ලියාපදිංචියෙන් ඵලදායි ආවරණයක් නොලැබේ. කෙසේ වෙතත් භාණ්ඩයක් නිපදවා එහි කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සඳහා මාස 12 ක කාලයක් හිමිවේ. ලියාපදිංචි නොකල සැලසුමක් සඳහා නීතියෙන් ලැබෙනුයේ ඉතා සීමිත ආවරණයකි. යුරෝපා සංගමය තුළ ලියාපදිංචි සැලසුමක් සඳහා වසර 25 ක ආවරණයක් ලැබෙන අතර ලියාපදිංචි නොවූ සැලසුමක් සඳහා හිමිවන්නේ වසර 3 ක ආවරණයක් පමණි.

මෙහි අඩංගු කරුණු ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් කෙරෙහි අවධානය යොමු කරයි. නමුත් සමහර රටවල විකල්ප ක්‍රම මගින් ද කාර්මික සැලසුම් සඳහා නීතිමය ආරක්ෂාව ලැබෙන බව මතක තබා ගත යුතුය.

- **ප්‍රතිරූපන අයිතිය** පිළිබඳ නීතිය මගින් කාර්මික සැලසුම් ආවරණය වන රටවල්ද ඇත. ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය ප්‍රධාන වශයෙන්ම සාහිත්‍යමය හා කලාත්මක නිර්මාණ සඳහා වන පරම අයිතිය ආරක්ෂාකර දෙයි. සමහර රටවල කාර්මික සැලසුම් සළකනු ලබන්නේ කාලාත්මක කර්තව්‍යයක් ලෙස හෝ ව්‍යවහාරික නිර්මාණයක් ලෙසය. ප්‍රතිරූපන අයිතිය ආරක්ෂණය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන්ට ප්‍රයෝජනවත් විකල්පයකි.

- සමහර රටවල කාර්මික සැලස්ම වෙළඳ ලකුණේ කොටසක් ලෙස ක්‍රියාත්මක වන විටදී එය **ත්‍රිමාණ සැලසුම් ආරක්ෂණය** යටතේ ආරක්ෂා කෙරේ. භාණ්ඩයේ හැඩය හා ඇසුරුම ඊටම ආවේනික සුවිශේෂ ලක්ෂණයක් ලෙස සැලකීම මීට හේතු විය හැකිය.

www.wipo.int/sme/

● **අසාධාරණ තරඟකාරීත්වය** පිළිබඳව නීති රීති මගින්ද සමහර රටවල කාර්මික සැලසුම් ආවරණය වේ.

ප්‍රතිරූපන අයිතිය, වෙළඳ ලකුණු හා අසාධාරණ තරඟකාරීත්වය නීතිය යටතේ ඔබගේ කාර්මික සැලසුම් ආරක්ෂණය පිළිබඳ වැඩිපුර විස්තර සඳහා කාණ්ඩ අංක 5 බලන්න.

## කාර්මික සැලසුම් ආරක්ෂණය මගින් ලැබෙන නීතිමය අයිතිවාසිකම් කවරේද?

කාර්මික සැලසුම් ආරක්ෂණය කළ පසු, අනවසර අනුකරණය කිරීමකට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේ පූර්ණ හැකියාව ලියාපදිංචිය හිමි පුද්ගලයාට හිමිවේ. මෙමගින් අදාල කාර්මික සැලසුම සහිත භාණ්ඩය **නිෂ්පාදනය කිරීමේ** හෝ **භාණ්ඩය සම්බන්ධ අර්පනයක් (Offer) ඉදිරිපත් කිරීමේ** හෝ **ආනයනය** **හෝ අපනයනය** කිරීමේ හෝ **විකිණීමේ** අයිතිය පූර්ණ වශයෙන්ම ලියාපදිංචිය දරණ පුද්ගලයාට හිමිවේ. එක් එක් රටවල පවත්නා නීතිය හා පරිචය අනුව ලියාපදිංචිය මගින් ලැබෙන ආවරණයේ පරාසය නිර්ණය වේ.

## කාර්මික සැලසුමක් ලෙස ලියාපදිංචි කළහැක්කේ මොනවාද?

එක් එක් රටවල පවත්නා නීතිය අනුව කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීමට නම් පහත සඳහන් අවශ්‍යතා එකක් හෝ වැඩි ගණනක් සපුරාලිය යුතුය.

● සැලසුම "**නව**" සැලසුමක් විය යුතුය. යම් සැලසුමක් නව සැලසුමක් ලෙස සලකනු ලබන්නේ ලියාපදිංචිය සඳහා අයදුම් කරන දිනය වන විට අයදුම් කර ඇති භාණ්ඩයේ කාර්මික සැලසුමට සමාන වෙනත් සැලසුමක් වෙළඳපල වෙත ඉදිරිපත් වී නොතිබුණහොත් පමණි.

## පරම අයිතිය

ඔබේ ආයතනය මගින් නව්‍යතාවයෙන් යුත් කුඩයක් නිර්මාණය කර එහි සැලසුම ජාතික බුද්ධිමය දේපල ආයතනයේ ලියාපදිංචි කර ඇතැයි සිතන්න. එවිට එම කුඩයේ කාර්මික සැලසුම පිළිබඳ නීතිමය හිමිකාරීත්වය ඔබට හිමිවේ. එවන් අවස්ථාවක සමාන සැලසුමකින් යුත් කුඩයක් නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ ආනයනය කිරීම කළහොත් නීතිමය පියවර ගෙන සිදුවූ අලාභ සඳහා වන්දි ලබා ගැනීමේ අයිතිය ද ඔබට හිමිවේ. ඔබගේ නිෂ්පාදනය සඳහා තරඟකාරී භාණ්ඩයක් නිපදවීමට වෙනත් ආයතනයකට ඇති අයිතිය වළක්වාලීමට ඔබට නොහැකි වුවත් නිපපාදකයෙකු ඔබගේ නිෂ්පාදනයට සමාන නිෂ්පාදනයක් කර ඔබගේ නිර්මාණ හැකියාවෙන් අයුතු ප්‍රයෝජන ගන්නේ නම් එය වළක්වා ගැනීමට නීතිමය වශයෙන් ඔබට හැකියාව ඇත.

එවන් අවස්ථාවක ඔබට ලබා ගත හැකි නීතිමය ආවරණය පිළිබඳව බුද්ධිමය දේපල පිළිබඳ නීතිඥවරයෙකුගෙන් උපදෙස් ලබා ගත හැකිය.



happy rain

- කාර්මික සැලසුම අනුකරණයෙන් තොරවූ, තමන් විසින් ම ස්වාධීනව හා ප්‍රථම වරට නිර්මාණය කළ **නවමු නිර්මාණයක්** (Original) විය යුතුය.

- නිර්මාණ ඊටම පොදු වූ **"ස්ව ලක්ෂණ"** වලින් සමන්විත විය යුතුය. එනම් යම් භාණ්ඩයක් භාවිතා කරන පුද්ගලයෙකුට ඊට සමාන වෙනත් භාණ්ඩයක් භාවිතා කිරීමේදී ඇතිවන හැඟීමට වඩා වෙනස් වූ විශේෂිත හැඟීමක් හෝ උපයෝගිතාවයක් ලබා දෙන ඊටම පොදු වූ ලක්ෂණ වලින් යුක්ත විය යුතුය.

සම්ප්‍රදායානුකූලව ආරක්ෂණය ලබා ගත හැකි සැලසුමක අංගයක් යනු සපත්තුවක හැඩය, කර්ණාභරණයක විලාසිතාව හෝ තේ බඳුනක ඇති අලංකරණයක් විය හැකිය. නවීන ලෝකය තුළ බොහෝ රටවල විවිධ භාණ්ඩ සඳහා විවිධාකාර සැලසුම් වලට ආරක්ෂාව ලබා ගනු දැකිය හැකිය. වර්තමාන **"ඩිජිටල් ලෝකයේ"** බුද්ධිමය දේපල ආරක්ෂණය ක්‍රම ක්‍රමයෙන් පරිඝණකයක භාවිතා වන සුරුවම්, අක්ෂර මුහුණත්, රූප සටහන් හා ජංගම දුරකථන වැනි නවීන ඩිජිටල් තාක්ෂණික උපකරණ දක්වා පැතිර ඇත.

## කාර්මික සැලසුම් ලෙස ආරක්ෂණය කළ නොහැකි දේ මොනවා ද?

බොහෝ රටවල නීතිය අනුව පහත සඳහන් දෑ බුද්ධිමය දේපල නීතිය යටතේ ආරක්ෂණය කළ නොහැකි බවට ප්‍රකාශ කරනු ලැබ ඇත.

- යම් භාණ්ඩයක් නව්‍ය භාණ්ඩයක් ලෙස හෝ මුල් නිර්මාණයක් ලෙස හෝ ඊටම පොදු වූ ස්වලක්ෂණ සහිත භාණ්ඩයක් ලෙස සැලකීමට තරම් ප්‍රමාණවත් සාධක නොමැති අවස්ථාවලදී.

- භාණ්ඩයේ කාර්මික ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය හා එහි කොටසක් ලෙස සලකනු ලබන ලක්ෂණ සඳහා, මෙවන් ලක්ෂණවලට ආරක්ෂණය ලබා ගත හැක්කේ වෙනත් බුද්ධිමය දේපල නීති ප්‍රතිපාදන අනුව සලකා බැලීමෙන් පසුව පමණි. උදාහරණ: පේටන්ට්, උපයෝගි ආකෘති (මොඩල) (Utility Model) හෝ වෙළඳ රහස් .

- රාජ්‍ය හා නිල සංකේතයන් වන ජාතික කොඩිය, රාජ්‍ය ලාංඡනය වැනි සලකුණු යොදා ගනිමින් නිම කළ කාර්මික සැලසුම්

- පොදු නීතියට, මහජන සාමයට හා සදාචාරයට පටහැනි ලෙස සැලකෙන සැලසුම්.

සැලසුම් ආරක්ෂණය කිරීමේ නීතිය පිළිබඳව තවත් වැදගත් කරුණක් වන්නේ සමහර රටවල **"අත්කම්"** මෙම නීතිය මගින් ආවරණය නොකිරීමය. එම රටවල කාර්මික සැලසුමක් ලෙස ලියාපදිංචි කිරීමට නම් එය නිෂ්පාදනය කරනු ලැබූ භාණ්ඩයක් හෝ කාර්මික හෝ තාක්ෂණික වශයෙන් ප්‍රතිනිර්මාණය කළ භාණ්ඩයක් විය යුතුය.

විවිධ රටවල නීතිමය තත්වයන් අනුව කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීමට බලපාන තවත් විවිධ සීමාවන් තිබිය හැකිය. මෙවන් අවස්ථාවලදී සුදුසුම ක්‍රියාමාර්ගය වනුයේ අදාළ රටේ බුද්ධිමය දේපල අධිකාරියේ උපදෙස් පැතීමයි.

## කාර්මික සැලස්මක් ලියාපදිංචි කළ හැක්කේ කෙසේද?

කාර්මික සැලස්මක් ලියාපදිංචි කිරීමේදී අනුගමනය කළයුතු විශේෂිත ක්‍රියාපටිපාටියක් ඇත.

- බුද්ධිමය දේපල කාර්යාලයෙන් ලබා ගත් **අයදුම් පත්‍රය** නිසි ලෙස සම්පූර්ණ කළ යුතුය. (ඇමුණුම් අංක Iහි දක්වා ඇති බුද්ධිමය දේපල කාර්යාල වල වෙබ් අඩවි අධ්‍යයනය කරන්න). නියමිත ආකෘති පත්‍රය සමග ඔබගේ නම, ඔබව සම්බන්ද කර ගත හැකි තොරතුරු සහ නිර්මාණයේ **පිඹුරුපත් සහ සේයා රූපද** ඇතුලත් විය යුතුය.

- සමහර රටවල නීතිය අනුව ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන සැලසුමේ **නව්‍යතාවය පිළිබඳව ලිඛිත ප්‍රකාශයක්** ඉදිරිපත් කළ යුතුය. මෙහි අඩංගු විය යුත්තේ අදාල භාණ්ඩයේ විස්තර නොව එම භාණ්ඩයට අදාල කාර්මික සැලසුමේ විස්තරයි. භාණ්ඩයේ නව්‍යතාවය මීට පෙර නිපදවූ සමාන භාණ්ඩ වලින් වෙනස් වන අයුරු නිවරැදි හා ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් කළ යුතුය. නිර්මාණාත්මක භාවය පිළිබඳව ඉතා පැහැදිලිව සඳහන් කිරීම වැදගත් වේ. එමෙන්ම සැලසුමට අදාල නව්‍යතා අතුරින් වඩාත්ම වැදගත් වන්නේ කුමක්ද යන්න හේතු සහිතව දැක්විය යුතුය. සමහර රටවල ලියාපදිංචිය පිළිබඳව කටයුතු කරන නිළධාරියා මෙම කරුණු තහවුරු කර ගනු වස් භාණ්ඩයේ සාම්පලයක් ඉල්ලා සිටීමට ඉඩ ඇත.

- ඒ ඒ රට අනුව නියම කරන ලද ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

- මෙම ක්‍රියාවලියට බුද්ධිමය දේපල පිළිබඳ නියෝජිතවරයෙකු/ නීතිඥවරයෙකුගේ සහය ලබා ගැනීමෙන් අඩුපාඩු වලින් තොර වෘත්තීමය තත්වයේ ලිපි ලේඛණ සකස් කර ගැනීමටත් එමගින් පහසුවෙන් හා ඉක්මනින් ලියාපදිංචිය ලබාගැනීමටත් හැකිවේ. මෙවන් අවස්ථා වලදී ලියාපදිංචිය අපේක්ෂා කරන පුද්ගලයා තම නියෝජිතයාට බලතල පැවරීම සනාථ කර ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

සමහර රටවල කාර්මික සැලසුමක් ලියාපදිංචි කරන්නේ ඒට අදාල පරිපාලනමය නියමයන් නිසි ලෙස සම්පූර්ණ වූ පසුව පමණි. තවත් සමහර රටවල දැනට පවතින සමාන ස්වභාවයේ සැලසුම් වලත් නව සැලසුමේ නව්‍යතාව පිළිබඳවත් දීර්ඝ පරීක්ෂා කිරීමකින් පසුව පමණක් ලියාපදිංචිය කරනු ලැබේ.

සැලසුමක් ලියාපදිංචි කිරීමෙන් පසුව සැලසුම් ලියාපදිංචි ලේඛණයේ ලේඛණගත කෙරේ. එමෙන්ම ඒ පිළිබඳව නිල වශයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීමද සැලසුම් **ලියාපදිංචි සහතිකය** නිකුත් කිරීමද සිදුවේ. සමහර අවස්ථාවලදී ලියාපදිංචිය **ප්‍රසිද්ධ කිරීම පමා කිරීම** සඳහා ඉල්ලුම් කළ හැක. එවිට එම සැලසුමේ රහස්‍යභාවය නිශ්චිත කාලයක් සඳහා තබා ගැනේ. මෙසේ සැලසුමක් ප්‍රසිද්ධ කිරීම පමා කරන්නේ වෙළඳපල සුරක්ෂිත කර ගැනීමේ උපායක් ලෙසිනි.

විදේශ රටකදී සැලසුම් ආරක්ෂණය කර ගැනීම පිළිබඳ විස්තරාත්මක තොරතුරු කාණ්ඩ අංක **3** යටතේ විස්තර කෙරේ.

## කාර්මික සැලසුමක් ලියාපදිංචිය සඳහා කොපමණ කලක් ගත වේද?

සාමාන්‍යයෙන් සැලසුමක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා මාස 6 සිට 12 දක්වා කාලයක් ගත වේ. ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ පැන නගින අමතර ගැටළු හා ප්‍රශ්න නිසා මෙම කාල පරාසය තවත් වැඩිවීමට පුළුවන. උදාහරණ ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධ නිලධාරියාගේ විරෝධතා හෝ වෙනත් පාර්ශව වල විරෝධතා හේතුවෙන් ලියාපදිංචිය ප්‍රමාද විය හැකිය.

## සැලසුමක් ලියාපදිංචි කිරීමට පෙර එහි රහස්‍යභාවය සුරැකීම වැදගත් වන්නේ ඇයි?

පවතින බුද්ධිමය දේපළ නීතිය යටතේ ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන සැලසුමක් රහස්‍ය ලෙස ආරක්‍ෂා කිරීම ඉතාම වැදගත් වේ. ඊට ප්‍රධානතම හේතුව නම් ලියාපදිංචි කිරීම සඳහා පළමු සුදුසුකම ලෙස "නව්‍යතාවය" සැලකෙන හෙයිනි. එහෙයින් සැලසුමක් ලියාපදිංචි කිරීමට ප්‍රථම තුන්වන පාර්ශවයක් වෙත හෙළිදරව් කරන්නේ නම් අදාල ගිවිසුම තුළ එහි රහස්‍යභාවය පිළිබඳව පැහැදිලි වගන්ති ඇතුලත් කළ යුතුය.

ව්‍යාපාරයේ පත්‍රිකාවක් මගින් හෝ භාණ්ඩ නාමාවලියක් මගින් ප්‍රසිද්ධ කිරීමෙන් පසු කිසියම් සැලසුමක් තවදුරටත් "නව්‍ය" සැලසුමක් ලෙස සැලකිය නොහැකිය. එසේ ප්‍රසිද්ධ කල සැලසුමක් ලියාපදිංචිය මගින් ආරක්‍ෂාකර ගැනීමට නම් ඒ පිළිබඳව "සහන කාලයක්" නීතියෙන් ලබා දී තිබිය යුතුය. එසේ නොමැති වුවහොත් ප්‍රථමයෙන් ඉල්ලුම් කරන්නාට සැලසුමේ අයිතිය හිමි කර දීමට නීතියෙන් ප්‍රතිපාදන ලබා දී ඇත. (විදේශ රටකදී ඔබගේ කාර්මික සැලසුම් ආරක්‍ෂණය කර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව වැඩදුර තොරතුරු පිටු අංක 16 හි සඳහන් වේ)

**උදාහරණ: බේබි ඇන්ඩ් චිල්ඩ්‍රන්**

කුඩා ළමයින්ගේ පහසුව පිණිස දිය නෑමට භාවිතා කරන එල්ලෙන තොටිල්ලක් නිර්මාණය කිරීමට බේබි ඇන්ඩ් චිල්ඩ්‍රන් සමාගම පියවර ගත්තේය. ඉතා සරල නිර්මාණයක්වූ මෙය ලොව පුරා මව්වරුන්ගේ හා ළදරුවන්ගේ ආකර්ශනයට භාජනය විය. මෙම භාණ්ඩයේ සැලසුම ලියාපදිංචි කිරීම සඳහා 2000 වසරේ මාර්තු මස ඉල්ලුම් කෙරිණි. ලියාපදිංචි කිරීම සම්පූර්ණ කළ පසු මෙම සමාගම මහා පරිමාණ වශයෙන් වෙළඳ කටයුතු ආරම්භ කළේය. මහද්වීප තුනක් පුරා විසිරුණු රටවල් 10 කට වැඩි ගණනක මෙම භාණ්ඩය අළෙවි කරන ළද්දේ සමාගමේ සෘජු මැදිහත් වීම මෙන්ම බලපත්‍ර මගින් පත්කරනු ලැබූ ඒජන්තවරුන් මගිනි.

මෙය ඉතා සාර්ථක භාණ්ඩයක් බවට පත්වූ අතර නිසි නීතිමය ආරක්‍ෂාව නිසා ලොව ප්‍රමුඛ පෙළේ වෙළඳ භාණ්ඩයක් ලෙස තවමත් මෙය අළෙවි කෙරේ.



අනුග්‍රහය: බේබි ඇන්ඩ් චිල්ඩ්‍රන්

## කාර්මික සැලසුම් ලියාපදිංචි නීතිය සම්බන්ධයෙන් සහන කාලය යනු කුමක්ද?

සමහර රටවල පවත්නා නීතිය අනුව කාර්මික සැලසුමක් ප්‍රසිද්ධ කිරීමෙන් පසු ලියාපදිංචි කිරීම සඳහා මාස 6ක් හෝ අවුරුද්දක සහන කාල සීමාවක් දෙනු ලැබේ.

මෙම කාලය ඇතුලත අදාල භාණ්ඩය විකිණීම මෙන්ම වෙළඳ ප්‍රදර්ශන වලදී ප්‍රදර්ශනය කිරීම, භාණ්ඩ නාමාවලවලි පළ කිරීම, පත්‍රිකා මගින් ප්‍රචාරය කිරීම ආදිය සිදු කළ හැකිය. මෙම කාලය ඇතුලත භාණ්ඩයේ නව්‍යතාවය ආරක්ෂා කර ගත යුතු අතර ලියාපදිංචිය සඳහා අවශ්‍ය කටයුතුද සිදුකල හැකිය.

කෙසේ වෙනත් භාණ්ඩයක සැලසුම ලියාපදිංචිය අවසන් වනතුරු එහි රහස්‍යභාවය සුරැකීම විචක්ෂනශීලී වේ. මෙම සහන කාලය තුල භාණ්ඩයේ සැලසුම පිළිබඳව පරම අයිතිය අදාල නිෂ්පාදනයට හිමි නොවේ. ඇතැම්විට සැලසුම අසාධාරණ තරගකාරී නීතියෙන් හෝ ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතියෙන් සුරක්පිත කරනු ලැබේ. ප්‍රතිරූපන අයිතිය පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා කාණ්ඩ අංක 5 බලන්න.

## කාර්මික සැලසුම් ආරක්ෂණය කොපමණ කලක් සඳහා වලංගු වන්නේ ද?

කාර්මික සැලසුමක ලියාපදිංචිය වලංගු වන කාල සීමාව රටින් රටට වෙනස් වේ. මෙහිදී **අවම කාල සීමාව වසර 10** ක් වන අතර සමහර රටවල සීමාව වසර 10 ක් ඉක්මවා වලංගු වේ. උදාහරණ ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ වසර 14 ක්ද, යුරෝපා සංගමය තුල වසර 25 ක් ලෙස ද සලකනු ලැබේ.

බොහෝ රටවල කාර්මික සැලසුම් ලියාපදිංචි කළ දිනෙන් වසර 5 කට පසු නැවත ලියාපදිංචිය අළුත් කළ යුතුය.

## කාර්මික සැලසුමක් ආරක්ෂණය කිරීමට කොපමණ මුදලක් වැය කළ යුතුද?

මෙය රටින් රටට වෙනස් වේ. නමුත් මේ සඳහා අදාල පිරිවැය වගී පිළිබඳව අවබෝධ කර ගැනීම වැදගත් වේ.

1 බුද්ධිමය දේපල කාර්යාලය සඳහා ගෙවිය යුතු **ලියාපදිංචි ගාස්තුව:** ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන සැලසුම් සංඛ්‍යාව හා බලාත්මක කිරීමට බලාපොරොත්තු වන රටවල් සංඛ්‍යාව අනුව මෙය වෙනස් වේ. උදාහරණ: යුරෝපා සංගමයට අදාල සියළුම රටවල් සඳහා ලියාපදිංචි කිරීමට යුරෝ 350 ක් වැය වේ. සැලසුම් ගණන 10 ක් වන විටදී මෙම මුදල යුරෝ 1,925 දක්වා වැඩි වේ. මේ පිළිබඳ විස්තරාත්මක තොරතුරු අදාල රටවල බුද්ධිමය දේපල කාර්යාල මගින් ලබා ගත හැකිය.

2 ලියාපදිංචි අයදුම් පත්‍රය පිළියෙල කිරීම හා බුද්ධිමය දේපල කාර්යාංශය වෙත ඉදිරිපත් කිරීමට විශේෂඥ දැනුම ඇති බුද්ධිමය දේපල පිළිබඳ නියෝජිතයෙකුගේ සහය ලබා ගන්නේ නම් ඒ සඳහා පිරිවැයක් දැරීමට සිදු වේ.

3 කාර්මික සැලසුම සඳහා පරම අයිතිය පවත්වා ගැනීමට නම් වසර 5කට වරක් ලියාපදිංචිය අළුත් කළ යුතු අතර ඒ සඳහා ගාස්තුවක් අය කෙරේ.

4 වෙනත් රටකදී ආරක්ෂණය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා **භාෂා පරිවර්තන ගාස්තුව**ක් ගෙවිය යුතුවේ

## භාණ්ඩයක කාර්මික සැලසුමකට බාහිර අලංකාරය සම්බන්ධ වැඩි දියුණු කිරීම් එකතු කර ඇති අවස්ථාවක ගත යුතු ක්‍රියාමාර්ග

භාණ්ඩයේ **ක්‍රියාකාරිත්වය පිළිබඳ ගුණාංග** ආරක්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් වඩාත්ම සුදුසු ක්‍රමය වන්නේ පේටන්ට් බලපත්‍රයක් හෝ උපයෝගිතා මොඩල ආරක්පණයක් ලබා ගැනීමයි. තවද මෙය වෙළඳ රහසක් ලෙස තබා ගැනීමද කල හැකිය.

ඔබ විසින් ජංගම දුරකථනයක් සැලසුම් කළේ යැයි සිතන්න. මෙහිදී ජංගම දුරකථනයට මෙන්ම ඒට එකතු කර ඇති නවාංගයන්ට ද කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම මගින් ආරක්ෂණය ලබා ගත හැකිද යන්න පිළබඳ ගැටළුවක් මතුවේ. මෙම නිෂ්පාදනය මූලික ඉලෙක්ට්‍රෝනික අංගයන් වලට නව්‍යතාවයක් එක් කර නිම කරන ලද්දකි. මෙහිදී ජංගම දුරකථනයේ නවමු සැලැස්ම කාර්මික සැලසුම් ආරක්පණය යටතේ ද නව්‍යතාවන් පේටන්ට් ආරක්පණය යටතේ ද ආරක්පණය කළ හැකිය. මෙහිදී ඇති වන තවත් ගැටළුවක් වන්නේ එක් භාණ්ඩයක් සම්බන්ධයෙන් මෙම ආරක්පණයන් දෙකම ලබා ගත හැකිද යන්නයි. පැහැදිලි පිළිතුර වන්නේ "ලබා ගත හැකිය" යන්නයි.



© නොකියා

## සැලසුම් ආරක්ෂණය හා ව්‍යාපාර උපායමාර්ග

සැලසුම් කළමනාකරය පිළිබඳ උපාය මාර්ග තීරණය කිරීමේ දී සැලසුමක් ලියාපදිංචි කරන්නේ කෙසේද? කවදාද? හා කොහේද? යන තීරණ ප්‍රධාන තැනක් ගනී. එම නිසා ව්‍යාපාරයක දීර්ඝ කාලීන උපාය මාර්ග සැලසුම් කිරීමේදී ද කාර්මික සැලසුම් පිළිබඳ තීරණ ඉතා වැදගත් වේ. ලබා ගැනීමට අපේක්ෂිත ආවරණයේ ස්වභාවය, පිරිවැය හා ලියාපදිංචිය මගින් ඇතිවන සඵලත්වය හා නීතිමය හිමිකාරිත්වය යන කරුණු උපාය මාර්ග පිළිබඳ තීරණ ගැනීම කෙරෙහි බලපායි. එනම්,

- සැලසුම ආයතනය තුළ නිර්මාණය කරන්නේ ද බාහිර පාර්ශවයන් මගින් කරවා ගනු ලබන්නේද යන්න තීරණය කිරීම සඳහා
- අලෙවි ප්‍රවර්ධනයේදී වෙළඳ ප්‍රචාරණයේදී හා වෙළඳපල තුළ ප්‍රචලිත කිරීමේදී සැලසුම මූලික වශයෙන් යොදාගන්නා අවස්ථාව තීරණය කිරීම සඳහා
- කුමන අපනයන වෙළඳපලක් අරමුණු කරගන්නේද යන්න තීරණය කිරීම සඳහා.
- ආර්ථික ප්‍රතිලාභ පදනම් කරගෙන අදාල භාණ්ඩය අලෙවි කිරීම බෙදා හැරීම පිළිබඳ අයිතිය බලපත්‍රයක් මගින් බාහිර ආයතනයකට පවරන්නේද යන්න තීරණය කිරීම සඳහා.

බොහෝ භාණ්ඩ සැලසුම් කරුවෝ තම සැලසුමේ විවිධ අංශ බුද්ධිමය දේපල නීතියේ විවිධ අංශ යටතේ ලියාපදිංචි කරනු ලබති. භාවිත මොඩලය (Utility Model) හා කාර්මික සැලසුම අතර මූලික වෙනස වටහා ගැනීම ඉතා වැදගත් වේ.

**පේටන්ට්/උපයෝගිතා මොඩලය භාණ්ඩයක ක්‍රියාකාරිත්වය පිළිබඳව නව සොයා ගැනීම් වලට අදාල වන අතර කාර්මික සැලසුම භාණ්ඩයේ බාහිර පෙනුම සඳහා අදාල වේ.**

## කාර්මික සැලසුම් ආරක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැක්කේ කාටද?

යම් සැලසුමක් නිර්මාණය කල තැනැත්තාට හෝ නිර්මාණකරු යම් ආයතනයක සේවයකු නම් එම ආයතනයට ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කල හැකිය. ඉල්ලුම්කරු තනි පුද්ගලයෙකු හෝ නීතිමය පුද්ගලභාවයක් හිමි ආයතනයක් විය හැක. ඉල්ලුම් පත්‍රය සෘජුවම එම තැනැත්තා/ආයතනය විසින් ඉදිරිපත් කළ හැකිය. බුද්ධිමය දේපල නීතිය සම්බන්ධ විශේෂඥයකුගේ සේවය ලබා ගන්නා අවස්ථාවකදී එම නියෝජිතයා මගින්ද ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ හැකිය.

ඉල්ලුම්කරු විදේශිකයෙකු වන අවස්ථාවකදී අදාල රටේ බුද්ධිමය දේපල අධිකාරී ආයතනය මගින් පිළිගත් නියෝජිතයෙකු මගින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

## කාර්මික සැලසුමක අයිතිය හිමිවන්නේ කාටද?

සැලැස්මක් නිර්මාණය කරන්නාට ඒ පිළිබඳව පූර්ණ අයිතිය හිමිවේ. නමුත් මේ සඳහා ව්‍යතිරේඛයක් ද ඇත. යම් ආයතනයක **සේවකයෙකු** තමාගේ සේවා ගිවිසුම අනුව, සාමාන්‍ය වැඩකරන කාලය තුලදී ඔහුගේ එදිනෙදා කාර්‍යයන් අතරතුර කරන ලබන

### උදාහරණ: ඩියුරාසෙල්

වසර 1980 දක්වාම ඩියුරාසෙල් සමාගම ඇල්කලයින් බැටරි පමණක් නිපදවූ සමාගමකි. 1981 වසරේදී සමාගම උපදේශකයකු යොදා ගෙන සාක්කුවේ ගෙන යා හැකි තාක්පණිකව ආලෝකය ලබා දෙන විදුලි පන්දමක් වැනි උපකරණයක් නිපදවා 1982 වසරේදී වෙළඳපලට නිකුත් කරන ලදි. වසර 2 කට පසුව මෙම උපකරණය එක්සත් රාජධානියේ සැලසුම් කවුන්සලය මගින් පිරිනමන ලද සම්මානයක් ද දිනා ගැනීමට සමත් විය. පසුව මෙම සමාගම විවිධාංගීකරණය කරන ලද මෙම උපකරණය විවිධවූ ඉලක්ක වෙළඳපල සඳහා විවිධාකාරයෙන් ඉදිරිපත් කරන ලදි. තරුණ තරුණියන් සඳහා වර්ණවත් ලෙස උපකරණය නිර්මාණය කරන ලදි. මෙම භාණ්ඩයේ නව්‍ය අංගයන් පේටන්ට් නීතිය යටතේ ආරක්ෂණය කර ඇති අතර ඩියුරාසෙල් සමාගමේ භාණ්ඩ අලෙවිකරණ බොහෝ රටවල නීතිය අනුව වෙළඳ සැලසුම ද ඒ ඒ රටවල ආරක්ෂණය කර ඇත.



® ඩියුරාසෙල්

නිර්මාණයක අයිතිය හිමි වන්නේ සේවා යෝජකයාටය. එසේ නොවීමට නම් විධිමත් පැවැරුම් ක්‍රියාවලියක් මගින් පැවරීමක් කර තිබිය යුතුය.

ආයතනයක් ගිවිසුමක් යටතේ බාහිර සැලසුම්කරුවකු මගින් සැලසුමක් නිර්මාණය කරනු ලැබුවහොත් එහි අයිතිය හිමි වන්නේ එම ආයතනයටය. එනම් ආයතනයක් එවන් සැලසුමක් නිර්මාණය කරනු ලබන්නේ එම ආයතනයේ අවශ්‍යතාවය මත වන හෙයින් එහි සැබෑ අයිතිකරුවා වන්නේ එම ආයතනයයි. එම නිසා සැලසුමක් නිර්මාණය කරවා ගැනීමට අදාල ගිවිසුමට එළඹීමේ දි එම සැලසුමේ අයිතිය පිළිබඳව කොන්දේසි ඇතුලත් කළ යුතුය. නිර්මාණයක නවමු සැලසුම සම්බන්ධ සියළුම සටහන් සඳහා ප්‍රකාශන අයිතිය ස්වයංක්‍රිය ලෙසම නිර්මාණකරුවාට හිමි වන නිසා ඒ පිළිබඳව කොන්දේසි ද ගිවිසුමේ සඳහන් කිරීම වැදගත් වේ.

## විවිධ සැලසුම් සඳහා එකම අයදුම් පත්‍රයක් මගින් ලියාපදිංචිය ඉල්ලුම් කළ හැකිද?

මෙය රටින් රටට වෙනස් වේ. සමහර රටවල එකම භාණ්ඩ පංතියකට අයත් භාණ්ඩ (10, 20 හෝ 50 පමණ) එකම අයදුම් පත්‍රයක් මගින් ලියාපදිංචි කළ හැකිය. එකම පංතියක අයත් භාණ්ඩ යන්න පිටු අංක 15 හි වැඩි දුර විස්තර කෙරේ.

උදාහරණයක් ලෙස පුටු, මේස, කණ්ණාඩි මේස වැනි එකම පංතියකට අයත් භාණ්ඩවල සැලසුම් ලියාපදිංචි කිරීමට අවශ්‍ය නිෂ්පාදකයෙකුට තනි ඉල්ලුම් පත්‍රයක්

### උදාහරණ: ට්‍රැක්ස්

ට්‍රැක්ස් යනු පොදු ස්ථානවල ඉඳගැනීම සඳහා නිපදවූ ආසන වර්ගයකි. මෙය OMK ඩිසයින් සමාගම සඳහා රොඩ්නි කින්ස්මන් නැමැත්තෙකු විසින් නිර්මාණය කරන ලද සැලසුමකි. මෙය මුලින්ම නිපදවනු ලබන්නේ බ්‍රිතාන්‍ය දුම්රිය සේවය සඳහාය. බ්‍රිතාන්‍ය දුම්රිය සේවය බලාපොරොත්තු වූයේ ඉතා හොඳ පෙනුමකින් යුත, සැප පහස, නඩත්තුව අවම ව, විවිධ කාලගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ආසන වර්ගයකි. ට්‍රැක්ස් ආසන ඉහත ලක්ෂණ වලින් යුක්තව නිෂ්පාදනය කෙරුණු අතර ඉතාම ජනප්‍රියත්වයට පත් විය. අදටත් ලොව පුරා විවිධ රටවල් 60 කට වැඩි සංඛ්‍යාවක ගුවන් තොටුපලවල මෙම ආසන දැකිය හැකිය.

ට්‍රැක්ස් ආසනවල කාර්මික සැලසුම එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, බෙනෙලක්ස් රටවල් (බෙල්ජියම, නෙදර්ලන්තය, ලක්සම්බර්ග්), ජර්මනිය, ඉතාලිය, ජපානය, හා ඇමරිකාව වැනි රටවල ලියාපදිංචිය මගින් ආරක්ෂණය කර ඇත. ඕනෑම රටක සමාගමක් මගින් මෙම සැලසුමට අදාල ආසන නිර්මාණය කරන්නේ නම් OMK ඩිසයින් සමාගම වෙත හිමිකාරභාගය ගෙවිය යුතුය.



අනුග්‍රහය: ට්‍රැක්ස්®

මගින්, තනි අයදුම්පතකට අදාල ගාස්තුව ගෙවීමෙන් මෙම සියළු භාණ්ඩ සඳහා රටවල් කිහිපයක වුවද ආරක්ෂණය ලබා ගත හැකිය. තවද මෙම භාණ්ඩ සමග විදුලි ලාම්පුවක් ද සපයන්නෙකුට ඒ සඳහා වෙනම අයදුම් කිරීමට සිදුවේ. ඊට හේතුව විදුලි ලාම්පුව; පුටු, මේස, ආදිය අයත් වන භාණ්ඩ පංතියට අයත් නොවීමය. නමුත් මෙවන් අවස්ථාවකදී ගෙවීමට සිදුවන ලියාපදිංචි ගාස්තුව තනි තනි භාණ්ඩ වෙන වෙනම ලියාපදිංචි කිරීමේ දී අදාල වන ගාස්තුවට වඩා අඩුවේ.

සමහර රටවල එක් සැලසුමක් සඳහා එක් අයදුම්පත්‍රය බැගින් ඉදිරිපත් කල යුතු වේ. නමුත් එක් සැලසුමක් යටතේ විවිධ විචල්‍යයන් (Variants) ලියාපදිංචි කිරීමට අවසර ලබාදී ඇති රටවල් ද දැකිය හැකිය.

- "විචල්‍යයන්" (Variants) යන්නට උදාහරණ: ආයතනයක් කරාබුවක් නිපදවියැයි සිතන්න. එකම සැලසුමක් යටතේ නිර්මාණය වූ කරාබුව කනට සවිකරන මාදිලියෙන් මෙන්ම කනෙහි සිදුරක් මගින් පැළඳිය හැකි මාදිලියෙන් නිර්මාණය කළ හැකිය. එකම ප්‍රභේදයක් යටතේ ලියාපදිංචි කිරීමට බලාපෙරොත්තු භාණ්ඩ එකිනෙකින් විශාල වශයෙන් වෙනස්කම් සහිත ව නිර්මාණය නොවිය යුතුය.

- "කුලක" (Set) ලෙස හඳුන්වන ලබන්නේ පොදු ලක්ෂණ වලින් යුක්තවූ සාමූහිකව විකුණනු ලබන හෝ භාවිතා කරනු ලබන භාණ්ඩ වේ. මේවා පොදු නිර්මාණ සැලසුම් වලින් සමන්විත භාණ්ඩ වේ. උදාහරණ මුළුතැන්ගෙයි උපකරණ සමග හැඳි ගැරුප්ප, පිහි ආදි උපකරණ, කොන්ඩ වියළන යන්ත්‍ර සමග ඊට අදාල බුරුසු. මේවා සාමූහිකව විකුණනු ලබන භාණ්ඩ වේ.

මේ අනුව තනි අයදුම්පත්‍රයක් මගින් ලියාපදිංචිය සඳහා භාණ්ඩ කාණ්ඩවල තිබිය යුතු විශේෂිත ලක්ෂණ හඳුනාගත යුතු බව පැහැදලි වේ. ඒ සඳහා බුද්ධිමය දේපල නීතිය සම්බන්ධ විශේෂ නියෝජිතයෙකුගේ හෝ බුද්ධිමය දේපල පාලන අධිකාරියේ හෝ උපදෙස් ලබා ගැනීම වැදගත් වේ.

## ජාත්‍යන්තර වර්ගීකරණ ක්‍රමය

අධ්‍යයනයේ පහසුව සඳහා කාර්මික සැලසුම් වර්ගීකරණය කිරීම සිදුකෙරේ. කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම් පත්‍රයේ තමන් විසින් අයදුම් කිරීමට බලාපොරොත්තු වන භාණ්ඩ පංතිය සඳහන් කළ යුතුය. බොහෝ රටවල මේ සඳහා වර්ගීකරණය ලෙස පිළිගෙන ඇත්තේ අන්තර්ජාතික කාර්මික සැලසුම් සඳහා වන ලොකාර්නෝ අන්තර්ජාතික වර්ගීකරණයයි. (මේ සඳහා අදාල වර්ගීකරණය ඇමුණුම් අංක 2 හි දක්වා ඇත.)

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා www.wipo.int.classifications/locarno/about/ වෙබ් අඩවිය බලන්න.

## ඔබගේ කාර්මික සැලසුමක අයිතිය බලපත්‍රයක් මගින් පැවරිය හැකිද?

මුලින් එකගවූ යම් කිසි අරමුණක් සඳහා කාර්මික සැලසුමක් භාවිත කිරීමේ අයිතිය **බලපත්‍රයක්** මගින් වෙනත් අයෙකු වෙත පැවරීමේ හැකියාව එහි මුල් අයිතිකරුට හිමිවේ. එවන් අවස්ථාවක, ඊට අදාල කොන්දේසි සහිත ගිවිසුමක් දෙපාර්ශවයන් විසින් අත්සන් කරනු ලැබේ.

මෙවන් ගිවිසුමක බලපත්‍ර ලාභියාට එම සැලසුම භාවිතා කල හැකි රටවල් පිළිබඳවත්, කාල සීමාව පිළිබඳවත් කුමන භාණ්ඩ වර්ග සඳහා භාවිතා කල හැකිද යන්නත් පැහැදිලිව දක්වනු ලැබේ.

එම සැලසුම, භාවිත කිරීමට බලාපොරොත්තු වන්නේ විදේශීය රටකදී නම් අදාල රටේ නීතිය අනුව ලියාපදිංචි කිරීමට අදාල අවශ්‍යතා සපුරාලිය යුතුය.

ආයතනයකට හෝ පුද්ගලයෙකුට අයිති කාර්මික සැලසුමක් භාවිතා කිරීමේ අයිතිය බලපත්‍රයක් මගින් දෙවන පාර්ශවයකට පැවරීම මගින් **අමතර ආදායමක්** ලබා ගැනීමට එහි හිමිකරුට හැකි වේ. ලියාපදිංචිය නිසා හිමිවන තනි අයිතිය නිසා ආරක්ෂිතභාවයේ ප්‍රතිලාභ හිමිකර ගැනීමට ද ලියාපදිංචිය දරන්නාට හැකි වේ.

කාර්මික සැලසුම් බලපත්‍රයක් මගින් පැවරීමේදී ඉතා පුළුල් කොන්දෙසි ගිවිසුමේ ඇතුලත් කරනු ලැබේ. එහි "බාහිර පෙනුම" පිළිබඳ කරුණු වලට අමතරව කාර්මික ගුණාංග ද ඇතුලත් කල හැකිය.

# 03. විදේශ රටකදී කාර්මික සැලසුම් ආරක්ෂණය

## විදේශ රටකදී කාර්මික සැලසුම් ආරක්ෂණය කළ යුත්තේ ඇයි?

ඔබ විසින් නිර්මාණය කල කාර්මික සැලසුමක් සහිත භාණ්ඩ විදේශ රටකට අපනයනය කිරීමට හෝ විදේශීය පාර්ශවයකට බලපත්‍රයක් මගින් පවරා දීමට බලාපොරොත්තු වන්නේ නම් අදාල රට තුල එම භාණ්ඩයේ සැලසුම ලියාපදිංචි කිරීමෙන් ආරක්ෂණය කිරීම ඉතාම වැදගත් වේ. එවිට එම රට තුල එම භාණ්ඩයේ කාර්මික සැලසුමට හිමි ආරක්ෂණයම විදේශ රටවලදී හිමිවේ.

## විදේශ රටකදී කාර්මික සැලසුම් ආරක්ෂණය ලබා ගත හැක්කේ කෙසේද?

සැලසුමකට ආරක්ෂණය හිමිවන්නේ ලියාපදිංචි කල රටේ දි හෝ එසේ කරනු ලබන කලාපයන් තුලදී පමණි. එම නිසා භාණ්ඩය අලෙවිකරනු ලබන රටතුල හෝ කලාපය තුල එසේ ලියාපදිංචි කිරීම වැදගත් වේ.

ඔබ විසින් පළමුවෙන් ලියාපදිංචිය සඳහා අයදුම් කල දින සිට මාස 6 ක් ඇතුලතදී වෙනත් රටකදී ඔබගේ සැලසුම පිළිබඳව අයිතිය සම්බන්ධයෙන් ඔබට ප්‍රමුඛත්වය හිමිවේ.

එසේ මාස 6 ක් ඉක්මවූ පසු වෙනත් රටකදී වුවද ආරක්ෂණට සඳහා අයදුම් කිරීමේ අයිතිය අහෝසි වේ. ඊට හේතුව තව දුරටත් එම සැලසුම "නව" සැලසුමක් ලෙස සලකනු නොලැබීමයි.

www.wipo.int/sme/

විදේශ රටකදී ආරක්ෂණය ලබා ගැනීම ක්‍රම 3 කට සිදුවේ.

1. **ජාතික මට්ටමෙන්**

කාර්මික සැලසුම ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන රටවල ජාතික බුද්ධිමය දේපල අධිකාරි ආයතන වෙත වෙන වෙනම අයදුම් කිරීම මෙහිදී සිදුවේ. මෙම ක්‍රමය මදක් දීර්ඝ හා අපහසු ක්‍රියාවලියකි. ඊට හේතුව නම් එසේ අයදුම් කිරීමේදී අදාල තොරතුරු විවිධ භාෂාවලට පරිවර්තනය කිරීමට සිදුවීමත් ඒ ඒ රටවල අවශ්‍යතා අනුව දැරීමට සිදුවන පිරිවැය අධික වීමත්ය.

2. **කලාපීය මට්ටමෙන්**

යම් එකගතාවයක් මත ඒකාබද්ධව කටයුතු කරන රටවල් රාශියක් පදනම් කරගෙන එම සමූහය ආවරණය පරිදි අදාල ප්‍රාදේශිය කාර්යාලයකට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කල හැකිය. එවැනි ප්‍රාදේශිය කාර්යාලයන් වලට උදාහරණ ලෙස:

- අප්‍රිකානු කලාපීය බුද්ධිමය දේපල කාර්යාලය (African Regional Intellectual Property Office - ARIPO) මෙමගින් ඉංග්‍රීසි භාෂාව කථා කරන අප්‍රිකානු රටවල් සමූහයක් ආවරණය වේ.
- බෙනෙලක්ස් සැලසුම් කාර්යාලය (Benelux Design Office - BDO) මෙමගින් බෙල්ජියම, නෙදර්ලන්තය හා ලක්සම්බර්ග් යන රටවල් ආවරණය වේ.
- යුරෝපා සංගමයට අදාල රටවල අභ්‍යන්තර වෙළද කටයුතු ඒකාබද්ධතාවය පිළිබද ප්‍රජා සැලසුම් කාර්යාලය (Office for Harmonization in the Internal Market - OHIM)
- ඇප්‍රිකේයින් ඩි ලා ප්‍රොපරියට ඉන්ටලැක්චුවලේ (the Organisation Africaine de la Propriété Intellectuelle (OAPI)) මෙමගින් ප්‍රංශ භාෂාව කථා කරන අප්‍රිකානු රටවල් ආවරණය වේ.

(ප්‍රාදේශිය කාර්යාලවල වෙබ් අඩවි සඳහා ඇමුණුම I බලන්න)

3. **ජාත්‍යන්තර මට්ටමෙන්**

තම සැලසුම් සඳහා ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂණය බලාපොරොත්තු වන ආයතනයකට ලෝක බුද්ධිමය දේපල ආයතනය මගින් පරිපාලනය කරනු ලබන කාර්මික සැලසුම් තැන්පතු පිළිබද අන්තර්ජාතික ගිවිසුමක් වන **"හේග් ගිවිසුම"** යටතේ ලියාපදිංචිය සිදුකල හැකිය.

"හේග් ගිවිසුමට" අයත් රටවල් ඇතුලත ආරක්ෂණය ලබා ගැනීම ලෝක බුද්ධිමය දේපල හිමිකම් ආයතනය හරහා ඉල්ලුම් කල හැකිය. එවිට "හේග් ගිවිසුම" අදාල සියලුම රටවලට හෝ තමන් කැමති රටවල් කිහිපයකට කාර්මික සැලසුම සඳහා ආරක්ෂණය ලබා ගත හැකිය. ඉතා සරල වුත් පිරිවැය අවම වුත් ක්‍රියාවලියක් වන මෙම ක්‍රමය මගින් වැඩි ආරක්ෂණයක් ද ලබා ගැනීමට හැකිවේ.

"හේග් ගිවිසුම" අදාල රටවල විස්තර හා ලිපි ඉල්ලුම් පත්‍රය සඳහා *www.wipo.int/hague/* වෙබ් අඩවිය බලන්න.

"හේග් ගිවිසුම" යටතේ ලියාපදිංචිය ක්‍රියාත්මක කිරීමේදී වැය වන පිරිවැය, ඉල්ලුම් කරන ලද සැලසුම් ගණන හා ආවරණය වන රටවල් ගණන අනුව වෙනස් වේ.

උදාහරණයක් ලෙස සැලසුම් 5 ක් සඳහා රටවල් 11ක ආරක්ෂණය ලබා ගැනීමට ජාත්‍යන්තර ක්‍රමය යටතේ (හේග් ගිවිසුම අනුව) ස්විස් ෆ්‍රාන්ස් 900 ක් පමණ වැය වේ.

## 04.කාර්මික සැලසුම බලාත්මක කිරීම

### ඔබගේ කාර්මික සැලසුම නීති විරෝධී ලෙස අනුකරණය කිරීම හෝ ඔබගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ග

බුද්ධමය දේපල අයිතිවාසිකම් පිළිබඳව නීතිමය පියවර ගැනීම තරමක් සංකීර්ණ වූ ක්‍රියාවලියකි. මෙහිදී වඩාත් විචක්ෂණශීලි උපාය මාර්ගය වන්නේ බුද්ධිමය දේපල පිළිබඳ නීති විශාරදයකුගේ මාර්ගයෙන් අදාල කටයුත්ත ඉටුකර ගැනීමයි. සැලසුමක් අනුකරණය කිරීම හෝ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුවුවහොත් ඒ සඳහා නීතිමය පියවරගැනීමේ වගකීම හා අයිතිය හිමිවන්නේද සැලසුමේ හිමිකරුටමය. එනම් **තමන් සතු කාර්මික සැලසුම් පිළිබඳව වෙළඳපලේ ඇතිවන තත්ත්වයන් පිළිබඳව (අනුකරණය කිරීම්. ව්‍යාජානුකරණය කිරීම ආදිය) අවධියෙන් සිටීම හා අවස්ථානෝචිතව අදාල නීතිමය පියවර ගැනීම පිළිබඳ වගකීම හිමිවන්නේද අදාල සැලසුම් හිමිකරුටමය.**

එවන් ආරවුලක් විසදා ගැනිම පිණිස යම් පාර්ශවයකට උපදෙසක් දිය හැක්කේ බුද්ධිමය දේපල නීතිය පිළිබඳව මනා පරිචයක් ඇති වෘත්තිය නීතිඥයෙකුට පමණි.

### ජාත්‍යන්තර මෝස්තර ආරක්ෂණය

වසර 2001 වන විට ජාත්‍යන්තර හේග් සම්මුතියට අදාලව කාර්මික සැලසුම් ලියාපදිංචි කළ ආයතන අතර ස්වොච් සමූහ ව්‍යාපාරය, ඉන්ටීරියර්, සෝනි. ඕවර්සීස්. හර්මස්. ඩායිම්ලර් ක්‍රිස්ට්ලර්. නෝකියා. විලරෝයි + බොප් ඒ ජී මෝලිනෙක්ස්. පිලිප්ස් ඉලෙක්ට්‍රෝනික්ස් හා සැලමොන් යන ආයතන විය. මෙම වසරේදී ස්වොච් සමූහය හේග් සම්මුතිය යටතේ සැලසුම් 103 ක් ලියාපදිංචියට ඉදිරිපත් කර තිබුණි. අත් ඔරලෝසුවල සුවිශේෂ පෙනුම පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමේ ප්‍රධානම ලක්ෂණය විය. මේ අනුව ස්වොච් සමාගම තමන් නිපදවන ඔරලෝසු වල ආකර්ශණීය බව නංවාලීමට විශාල වශයෙන් ආයෝජනය කලේය. එම කාර්මික සැලසුම් වලට නිසි ආරක්ෂාව ලබා ගැනීම නිසා ඉතා ඉහල ප්‍රතිලාභ අත්කර ගැනීමට එම සමාගමට හැකි විය.



අනුග්‍රහය: ස්වොච් ඒ ජී

www.wipo.int/sme/

ඔබ විසින් ආරක්ෂණය කරන ලද කාර්මික සැලසුමක් වෙනත් පාර්ශවයන් විසින් අනුකරණය කිරීම හෝ කූටාණුකරණය කිරීම නිසා **අයිතිවාසිකම් උල්ලංඝනය** වීමක් සිදුවන්නේ නම් පළමු පියවර ලෙස එම කාර්‍ය්‍යය "අත්හිටුවීමේ හෝ වලක්වාලීමේ" ලිපියක් යැවීම කළ යුතුය. මෙහිදී නමන් සතු නීත්‍යානුකූල අයිතිය පිළිබඳවත් එය උල්ලංඝණය කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳවත් එම පාර්ශවය දැනුවත් කළ යුතුය. මෙවැනි ලිපියක් බුද්ධිමය දේපල පිළිබඳ විශාරදයෙකුගේ මග පෙන්වීම යටතේ පිළියෙල කළ යුතුය. මෙවැනි ලිපියක් යැවීමෙන් පසුව පවා දිගින් දිගටම අනුකරණය කිරීම හෝ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සිදුවන්නේ නම් ඒ පිළිබඳව නීතිමය පියවර ගත යුතුය. පූර්ව දැනුම් දීමකින් තොරව එවැනි ආයතනයක් හෝ පුද්ගලයකු වෙත ගොස් පරීක්ෂා කිරීම සිදුකළ හැකි අතර ඒ සඳහා පොලීසියේ හා උසාවි නියෝගයක් ලබා ගත යුතුය

සමහර රටවල රේගු නීතිය මගින් කූඨාණුකරණ භාණ්ඩ ආනයනය පිළිබඳ ආරක්පණ විධි විධාන සලස්වා ඇත.

කූඨාණුකරණය පිළිබඳව සිදුවීමකදී නීතිමය පියවර ගත යුත්තේ වෘත්තිය නීතිවේදියෙකුගේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව පමණි.

## 05. කාර්මික සැලසුම් ආරක්ෂණය පිළිබඳව වෙනත් නීතිමය මෙවලම්

මෝස්තර සඳහා ප්‍රතිරූපන අයිතිය ආරක්ෂණය හා කාර්මික සැලසුම් ආරක්ෂණය අතර වෙනස කුමක්ද?

සමහර රටවල බල පවත්නා නීතිය අනුව මෝස්තර සඳහා ප්‍රතිරූපන අයිතිය හිමිවේ. උදාහරණ ලෙස රෙදි පිළි මෝස්තර, පෙහෙකම් මෝස්තර දැක්විය හැකිය.



බොහෝ රටවල මෙවැනි භාණ්ඩ සඳහා ප්‍රතිරූපන අයිතිය මෙන්ම කාර්මික සැලසුම් පිළිබඳ අයිතිය නීතිය මගින් ලබා දෙයි. සමහර රටවල මෙම අංග දෙක එකිනෙකින් පූර්ණ වශයෙන් පරිබාහිර ලෙස සලකා නීතිමය ආවරණය සලසා ඇත.

ඔබ විසින් මෝස්තරයක් ආරක්ෂාකර ගැනීමට අදහස් කරනු ලබන්නේ නම් ප්‍රතිරූපන අයිතිය හා කාර්මික සැලසුම් යන අංග දෙක වෙන් වෙන්ව හඳුනා ගත යුතුය.

මෙම අංග දෙක අතර මූලික වෙනස්කම් පහත අයුරින් දැක්විය හැක.

## ලියාපදිංචිය

- කාර්මික සැලසුම් පිළිබඳ නීති යටතේ කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීමේදී අදාල සැලසුම ප්‍රසිද්ධියට පත් කිරීමට ප්‍රථම ලියාපදිංචි කිරීම කළ යුතුය. යම් හෙයකින් අදාල සැලසුම අනුකරණයට හෝ කූඨානුකරණයකට භාජනය වුවහොත් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීම මගින් සැලසුමේ හිමිකාරිත්වය පිළිබඳව ශක්තිමත් ලෙස තහවුරු කර ගැනීමට හැකිය.

- ප්‍රතිරූපන අයිතිය පිළිබඳ තත්ත්වය මීට වඩා වෙනස්වේ. එනම් විධිමත් ලියාපදිංචිවීමකින් තොරව වුවද නිර්මාණයක නීත්‍යානුකූල අයිතිය නිර්මාණකරුට හිමිවේ. නමුත් සමහර රටවල පවතින විධිමත් ලේඛණාරක්ෂණාගාරයකට තම නිර්මාණය ඉදිරිපත් කර සහතිකයක් ලබා ගෙන යම් ආරක්ෂණයක් ලබා ගැනීමේ හැකියාව ඇත.

## කාල සීමාව

- කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම මගින් ලබන ආරක්ෂාව වසර 10 සිට 25 දක්වා කාලයකට බල පැවැත්වේ. මෙම කාල සීමාව ලියාපදිංචිය ඉල්ලුම් කරන රට අනුව වෙනස් වේ. සාමාන්‍යයෙන් ලියාපදිංචි ක්‍රියාවලියට දිගු කාලයක් ගත වන නිසා සමහර සැලසුම් සඳහා ආවරණය ලබා ගැනීමට අපහසු අවස්ථාද දක්නට ලැබේ. උදාහරණ ලෙස විලාසිතා දැක්විය හැක. ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අවසන් වීමට පෙර විලාසිතාවක ආයුකාලය අවසන් විය හැකිය.

- සමහර රටවල ප්‍රතිරූපන අයිතිය අදාල හිමිකරු මියගොස් වසර 50 හෝ 75ක් පමණ දක්වා බලාත්මකව පවතින අයුරින් නීති සකසා ඇත.

## ආරක්ෂණයට අදාල විෂය පථය

- කාර්මික සැලසුමක් ලියාපදිංචිය තුලින් ලියාපදිංචි කරන්නාට හිමිවන්නේ පරම අයිතියකි. ඒ අනුව නීත්‍යානුකූල හිමිකරුගේ අයිතීන් උල්ලංඝනය කිරීමක් ඇති අවස්ථාවක එය හිතා මතා කළ දෙයක් නොවූවද නීත්‍යානුකූල හිමිකරුගේ අයිතීන් උල්ලංඝනය කිරීමක් ලෙස නීතිය සලකයි.

- ප්‍රතිරූපන අයිතිය පිළිබඳ නීතිය අනුව තම නිර්මාණයේ අයිතිකරු තමන්ගේ නිර්මාණය සෘජුවම අනුපිටපත්කර ඇති බව හෝ ප්‍රතිනිර්මාණය කර ඇති බව ඔප්පු කළ යුතුය.

## භාණ්ඩ වර්ග

- බොහෝ රටවල සියළුම මෝස්තර/සැලසුම් ප්‍රතිරූපන ආරක්ෂණ නීතිය යටතේ ලියාපදිංචි කළ නොහැක. මේ යටතේ අදාල වන්නේ කලාත්මක නිර්මාණ පමණි. කාර්මික සැලසුම මෝස්තර අතර පැහැදිලි ආකාරයෙන් වෙන් වෙන්ව හඳුනා ගත නොහැකි වුවත් භාණ්ඩයක හැඩය ප්‍රතිරූපන ආරක්ෂක නීතිය මගින් ආවරණය නොවේ. නමුත් පෙහෙකම් මෝස්තර මෙම අංශ දෙක යටතේම ආරක්ෂණය කළ හැකිය.

## පිරිවැය

- ආරක්ෂණය ලබා ගැනීමට අපේක්ෂා කරන රටවල් සඳහා ලියාපදිංචි කිරීමේදී ඊට අදාල පිරිවැයක් දැරීමට සිදුවේ. තවද අයදුම්පත් කෙටුම්පත් කිරීම සඳහා බුද්ධිමය දේපල නීති විශාරදයෙකුගේ මග

පෙන්වීම ලබාගත හොත් ඒ සඳහා ද අමතර මුදලක් වැය වේ.

- ප්‍රතිරූපන අයිතිය ආරක්ෂණය විධිමත් නීතිරීති නොමැති හෙයින් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සෘජු පිරිවැයක් පැන නොනගී. නමුත් ඒ හා බැඳුණු පිරිවැය කිහිපයක් හඳුනා ගත හැකිය. (a) ලේඛණාගාරයක් (Copyright Depository) සහිත රටවල දී නම් නිර්මාණ එහි ලියාපදිංචි කිරීම පිළිබඳව පිරිවැයක් තිබිය හැකිය. (b) යම් ආරවුලක් සහගත තත්ත්වයන් පැන නැගුණු අවස්ථාවකදී අයිතිය තහවුරු කිරීමේ ක්‍රියාවලියක් සඳහා පිරිවැයක් දැරීමට සිදු වේ.

**සංක්ෂිප්ත ලෙස** දැක්වුවහොත් ලියාපදිංචි කිරීම තුලින් ලබන ආරක්ෂණය මගින් දෙවන පාර්ශවයන් හිතා මතාම කරනු ලබන හෝ අනභිප්‍රායික ලෙස කරනු ලබන අනුකරණයන්ට එරෙහිව පියවර ගැනීමේ හැකියාව හිමිවේ. ලියාපදිංචි සහතිකය මෙවන් අවස්ථවක අයිතිය තහවුරු කිරීම පිළිබඳව යොදා ගත හැකි ප්‍රබලතම ලියවිල්ලය. කෙසේ වෙතත් මෙම ක්‍රියාවලිය සඳහා මූල්‍යමය හා පරිපාලනමය පිරිවැයක් දැරීමට ආයතන වලට සිදුවේ.

යම් හෙයකින් සැලසුමක් ලියාපදිංචි නොකරන්නේ නම් අදාල සැලසුම නිර්මාණය කිරීමට අදාළ සියළුම තොරතුරු මනා ලෙස ලේඛණගත කර තබා ගැනීම විචක්ෂණශීලී වේ. උදාහරණ ලෙස මෑතකදී එක්සත් රාජධානියේ කරන ලද සමීක්ෂණයකදී අදහස් දැක්වූ පෙහෙකම් සැලසුම්කරුවන්ගේ 80% ක් කියා සිටියේ එසේ **ලිඛිත තොරතුරු තබා ගැනීම ප්‍රතිරූපන අයිතිය තහවුරු කර ගැනීමේදී ඉතා වැදගත්** වන බවයි.

උදාහරණ ලෙස කොකා කෝලා බෝතලය හෝ ටොබල්රෝන් චොකලට් ඇසුරුම දැක්විය හැකිය.

## වෙළඳ ලකුණු ආරක්ෂණ නීතිය යටතේ පිරිසැලසුම් ආවරණය කරගත හැකි අවස්ථා මොනවාද?

වෙළඳ ලකුණු යනු වචන හෝ සලකුණක් හෝ ඒ දෙකෙන්ම සමන්විත වන විශේෂිත සංකේතයකි. මෙමගින් භාණ්ඩයක් හෝ ව්‍යාපාර ආයතනයක් තරගකාරී අනිකුත් භාණ්ඩයකින් ආයතකයකින් වෙන් කර හඳුනා ගැනීමේ හැකියාව ලැබේ.

සමහර අවස්ථාවලදී භාණ්ඩයක ස්වරූපය, මෝස්තරය හෝ ඇසුරුම ඊටම ආවේණික ලක්ෂණ ලෙස සලකා "ත්‍රිමාණ" වෙළඳ සළකුණක් ලෙස ලියාපදිංචි කළ හැකිය.




ටොබල්රෝන්® මෙය ක්‍රාෆ්ට් ෆුඩ් සමූහයේ ලියාපදිංචි වෙළඳ ලකුණකි.

නිර්මාණ වෙළඳ ලකුණු පිළිබඳව නිගමනය කිරීමේදී බුද්ධිමය දේපල පිළිබඳ නීති විශාරදයෙකුගේ උපදෙස් ලබා ගැනීම වඩා සුදුසු වේ.

වෙළඳ ලකුණුවල ලියාපදිංචිය අසීමිත කාල පරාසයන් සඳහා දීර්ඝ කල හැකිය. නමුත් කාර්මික සැලසුමක් වසර10-25 වැනි සීමිත කාලයක් සඳහා වලංගුවේ. මෙම අංශ දෙක ලියාපදිංචි කිරීම සඳහා වැය වන වියදමද එකිනෙකට වෙනස් වේ. නමුත් නීතිමය රාමුව තුල මෙම අංශ දෙක වෙන වෙනම හෝ ඒකාබද්ධව පවති.

## අසාධාරණ තරඟකාරිත්වය පිළිබඳ නීතිය මගින් ඔබගේ සැලසුම් සඳහා ආරක්ෂාව ලැබේ ද?

බොහෝ රටවල අයුතු තරඟකාරිත්වය පිළිබඳ නීතිය යටතේ කාර්මික සැලසුම් සඳහා ආරක්ෂණය ලැබේ.

භාණ්ඩයක සැලසුම් ඉතා නිහින ලෙස අනුපිටපත් කිරීම, අනුකරණය කිරීම හා භාණ්ඩයක කීර්තිනාමයෙන් අයුතු ප්‍රයෝජන ගැනීම ආදිය අසාධාරණ තරඟකාරිත්වය පිළිබඳ නීතිය මගින් ආවරණය වේ. නමුත් අසාධාරණ තරඟකාරිත්වය පිළිබඳව නීතිය බලාත්මක කිරීමට අපහසු හා දුර්වල නීතියක් ලෙස සැලකේ.

## ඇමුණුම් අංක I - ප්‍රයෝජනවත් වෙබ් අඩවි කිහිපයක්

- ව්‍යාපාර සම්බන්ධ අනෙකුත් බුද්ධිමය දේපල නීති ගැටළු පිළිබඳ තොරතුරු සඳහා
  *www.wipo.int/sme/*

- කාර්මික සැලසුම්
  *www.wipo.int/about-ip/en/*

- කාර්මික සැලසුම් ලියාපදිංචිය පිළිබඳව ප්‍රායෝගික කරුණු සඳහා
  *www.wipo.int/directory/en/urls.jsp*
  (මේ පිළිබඳව විවිධ රටවල බුද්ධිමය දේපල කාර්යාල වෙබ් අඩවි සඳහා ඇමුණුම II බලන්න)

- හේග් ගිවිසුම යටතේ කාර්මික සැලසුම්
  *www.wipo.int/hague/en/*

- කාර්මික සැලසුම් පිළිබඳ අන්තර්ජාතික වර්ගීකරණය පිළිබඳව ලෝකාර්නෝ ගිවිසුමේ තොරතුරු
  *www.wipo.int/classifications*

- බේරුම්කරණය හා මැදිහත්කරණය
  *http://arbiter.wipo.int/*

## ඇමුණුම් අංක II - අන්තර්ජාල ලිපිනයන්

## ජාතික හා කලාපීය බුද්ධිමය දේපල කාර්යාල වලට අදාල අන්තර්ජාල ලිපිනයන්

| | |
|---|---|
| අප්‍රිකානු බුද්ධිමය දේපල ආයතනය | www.oapi.wipo.net |
| ඇල්ජීරියාව | www.inapi.org |
| ඇල්බේනියාව | www.alpto.gov.al |
| ඇන්ඩෝරා | www.ompa.ad |
| ආර්ජන්ටිනාව | www.inpi.gov.ar |
| ආර්මේනියාව | www.armpatent.org |
| ඔස්ට්‍රේලියාව | www.ipaustralia.gov.au |
| ඔස්ට්‍රියාව | www.patent.bmvit.gv.at |
| බහරේනය | www.gulf-patent-office.org.sa/bahrainframe.htm |
| බාර්බඩොසය | www.caipo.org |
| බෙලාරසය | www.belgospatent.org/english/about/history.html |
| බෙල්ජියම | www.mineco.fgov.be |
| බෙලිස් | www.belipo.bz |
| බෙනෙලක්ස් | www.boip.int |
| බෙනින් | www.oapi.wipo.net |
| බොල්වියාව | www.senapi.gov.bo |
| බොස්වානාව | www.aripo.org |
| බ්‍රසීලය | www.inpi.gov.br |
| බල්ගේරියාව | www.bpo.bg |
| බර්කිනෝ ෆාසෝ | www.oapi.wipo.net |
| බුරුන්දි | www.oapi.wipo.net |
| කාම්බෝජියාව | www.moc.gov.kh |
| කැමරූන් | www.oapi.wipo.net |
| කැනඩාව | www.opic.gc.ca |
| මධ්‍යම අප්‍රිකානු ජනරජය | www.oapi.wipo.net |
| චැඩ් | www.oapi.wipo.net |
| චිලී | www.dpi.cl |
| චීනය | www.sipo.gov.cn |
| චීනය (හොංකොං-සාර්) | www.ipd.gov.hk |
| චීනය (මාකෝ) | www.economia.gov.mo |
| චීනය (මාර්ක්) | www.saic.gov.cn |
| කොලොම්බියාව | www.sic.gov.co |
| කොංගෝව | www.oapi.wipo.net |

| | |
|---|---|
| කොස්ටෝරිකාව | *www.registronacional.go.cr* |
| කෝජ්ට් ඩී අයිවරි | *www.oapi.wipo.net* |
| ක්‍රොඒෂියාව | *www.dziv.hr* |
| කියුබාව | *www.ocpi.cu* |
| සයිප්‍රසය | *www.mcit.gov.cy/mcit/drcor/drcor.nsf* |
| මහජන චෙක්නියාව | *www.upv.cz* |
| ප්‍රජාතන්ත්‍රවදි එක්සත් කොන්ගෝව | *www.oapi.wipo.net* |
| ඩෙන්මාර්කය | *www.dkpto.dk* |
| එක්සත් ඩෝමේනියාව | *www.seic.gov.do/onapi* |
| ඊජිප්තුව | *www.egypo.gov.eg* |
| එල් සැල්වදෝරය | *www.cnr.gobs.sv* |
| එස්තෝනියාව | *www.epa.ee* |
| යුරේපියා කාර්යාලය | *www.eapo.org* |
| යුරෝපා සංගමය | *www.oami.eu.int* |
| ෆින්ලන්තය | *www.prh.fi* |
| ප්‍රංශය | *www.inpi.fr* |
| ගැබන් | *www.oapi.wipo.net* |
| ගැම්බියාව | *www.aripo.org* |
| ජොර්ජියාව | *www.sakpatenti.org.ge* |
| ජර්මනිය | *www.dpma.de* |
| ඝානාව | *www.aripo.org* |
| ග්‍රීසිය | *www.obi.gr* |
| හොන්දුරාසය | *www.sic.gob.hn/pintelec/indice.htm* |
| හංගේරියාව | *www.mszh.hu/english/index.html* |
| අයිස්ලන්තය | *www.patent.is/focal/webguard.nsf/key2/indexeng.html* |
| ඉන්දියාව | *www.ipindia.nic.in* |
| ඉන්දුනීසියාව | *www.dgip.go.id* |
| අයර්ලන්තය | *www.patentsoffice.ie* |
| ඊශ්‍රායලය | *www.justice.gov.il* |
| ඉතාලිය | *www.uibm.gov.it* |
| ජැමෙයිකාව | *www.jipo.gov.jm* |
| ජපානය | *www.jpo.go.jp* |
| ජෝර්දානය | *www.mit.gov.jo* |
| කසකස්තානය | *www.kazpatent.org/english* |
| කෙන්යාව | *www.aripo.org* |
| කුවේටය | *www.gulf-patent-office.org.sa* |
| ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | *www.stea.la.wipo.net* |
| ලැට්වියාව | *www.lrpv.lv* |

| | |
|---|---|
| ලෙබනනය | *www.economy.gov.lb* |
| ලෙසතෝ | *www.aripo.org* |
| ලැස්ටෙන්ස්ටෙනියාව | *www.european-patent-office.org* |
| ලිතුවේනියාව | *www.vpb.lt* |
| ලක්සම්බර්ග් | *www.etat.lu/ec* |
| මාලවි | *www.aripo.org* |
| මැලේසියාව | *www.mipc.gov.my* |
| මාලි | *www.oapi.wipo.net* |
| මැක්සිකෝව | *www.impi.gob.mx* |
| මොනාකෝ | *www.european-patent-office.org/patlib/country/monaco* |
| මොන්ටෙනේග්‍රෝ | www.yupat.sv.gov.yu |
| මොරොක්කෝව | *www.ompic.org.ma* |
| මොසැම්බියාව | *www.aripo.org* |
| නැම්බියාව | *www.aripo.org* |
| නේපාලය | *www.ip.np.wipo.net* |
| නෙදර්ලන්තය | *www.octrooicentrum.nl* |
| නවසීලන්තය | *www.iponz.govt.nz* |
| නයිගර් | *www.oapi.wipo.net* |
| නොර්වේජියාව | *www.patentstyret.no* |
| ඕමානය | *www.gulf-patent-office.org.sa* |
| පැනමාව | *www.digerpi.gob.pa* |
| පේරු | *www.indecopi.gob.pe* |
| පිලිපීනය | *www.ipophil.gov.ph* |
| පෝලන්තය | *www.business.gov.pl/Intellectual,property,protection,90.html* |
| පෘතුගාලය | *www.inpi.pt* |
| කටාර් රාජ්‍යය | *www.gulf-patent-office.org.sa* |
| එක්සත් කොරියාව | *www.kipo.go.kr* |
| එක්සත් මොල්ඩෝවාව | *www.agepi.md* |
| රුමේනියාව | *www.osim.ro* |
| ෆෙඩරල් රුසියාව | *www.rupto.ru* |
| සාන්ත වින්සන්ට් හා ග්‍රෙනෙඩයින්ස් | *196.1.161.62/govt/cipo/index.asp* |
| සවුදි අරාබිය | *www.gulf-patent-office.org.sa* |
| සෙනෙගාලය | *www.oapi.wipo.net* |
| සර්බියාව | *www.yupat.sb.gov.yu* |
| සියෙරා ලියෝන් | *www.aripo.org* |
| සිංගප්පූරුව | *www.ipos.gov.sg* |
| එක්සත් ස්ලෝවැකියාව | *www.indprop.gov.sk* |

| | |
|---|---|
| ස්ලෝවේනියාව | *www.uil-sipo.si/Default.htm* |
| සෝමාලියාව | *www.aripo.org* |
| දකුණු අප්‍රිකාව | *www.cipro.gov.za* |
| ස්පාඤ්ඤය | *www.oepm.es* |
| සුඩානය | *www.aripo.org* |
| ස්වාසිලන්තය | *www.aripo.org* |
| ස්වීඩනය | *www.prv.se* |
| ස්විට්සර්ලන්තය | *www.ige.ch* |
| එක්සත් අරාබි සිරියාව | *www.himaya.net* |
| ටජිකිස්තානය | *www.tipat.org* |
| තායිලන්තය | *www.ipthailand.org* |
| යුගෝස්ලෝවියාව මැසිඩෝනියාව | *www.ippo.gov.mk* |
| ටෝගෝ | *www.oapi.wipo.net* |
| ට්‍රිනිඩැඩ් සහ ටැබෝගෝ | *www.ipo.gov.tt/home.asp* |
| ටියුනිසියාව | *www.inorpi.ind.tn* |
| තුර්කිය | *www.turkpatent.gov.tr* |
| ටර්ක්මෙන්ස්තානය | *www.eapo.org* |
| උගන්ඩාව | *www.aripo.org* |
| යුක්රේනියාව | *www.sdip.gov.ua* |
| එක්සත් අරාබි රාජධානිය | *www.gulf-patent-office.org.sa* |
| මහා බ්‍රිතාන්‍ය | *www.patent.gov.uk* |
| ටැන්සානියාව | *www.aripo.org* |
| ඇමරිකා එක්සත් රාජධානිය | *www.uspto.gov* |
| උරුගුවාව | *www.dnpi.gub.uy* |
| උස්බෙකිස්තානය | *www.patent.uz* |
| වෙනිසියුලාව | *www.sapi.gov.ve* |
| යේමනය | *www.most.org.ye* |
| සැම්බියාව | *www.aripo.org* |
| සිම්බාබුවේ | *www.aripo.org* |

සටහන

යාවත් කාලීන කරන ලද තොරතුරු පහත අන්තර්ජාල ලිපිනයන් මගින් ලබා ගත හැකි බව සලකන්න.

www.wipo.int/members/en/ & www.wipo.nt/diectory/en/urls.jsp

## ඇමුණුම අංක III

# ලෝකාර්නෝ ගිවිසුම යටතේ කාර්මික සැලසුම් පිළිබඳ අන්තර්ජාතික වර්ගීකරණය

භාණ්ඩ කාණ්ඩ වර්ග

1. ආහාර ද්‍රව්‍ය
2. ඇඳුම් හා තොරොම්බල් බඩු
3. සංචාරක, සූර්ය ආවරණ, පුද්ගලික බඩු බාහිරාදිය (වෙනත් කාණ්ඩයක් යටතේ ආවරණය නොවුණු)
4. බුරුසු ආශ්‍රිත නිෂ්පාදන
5. ඇගලුම් නිෂ්පාදන භාණ්ඩ හා ඇතුරුම් අමුද්‍රව්‍ය
6. ගෘහ භාණ්ඩ
7. ගෘහ උපකරණ වෙනත් (වෙනත් කාණ්ඩයක් යටතේ ආවරණය නොවුණු)
8. මෙවලම් හා දෘඩාංග
9. භාණ්ඩ ප්‍රවාහනයේදී භාවිත කරන ඇසුරුම් හා භාජන
10. බිත්ති ඔරලෝසු, අත් ඔරලෝසු හා වෙනත් කාල සනක උපකරණ
11. අලංකාර උපකරණ
12. ප්‍රවාහන ක්‍රමවේද හා එසවුම් යන්ත්‍ර
13. විදුලිය නිපදවීමේ, බෙදාහැරීමේ හා තොරතුරු ලබා ගැනීමේ උපකරණ
14. තැටිගත කිරීමේ, සන්නිවේදනය කිරීමේ හා තොරතුරු ලබා ගැනීමේ උපකරණ
15. යන්ත්‍ර (වෙනත් කාණ්ඩයක් යටතේ ආවරණය නොවුණු)
16. ඡායාරූප, සිනමා යාන්ත්‍රික හා ප්‍රකාශන උපකරණ
17. සංගීත උපකරණ
18. මුද්‍රණ හා කාර්යාල යන්ත්‍ර
19. ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, ඉගැන්වීම් උපකරණ
20. විකුණුම් හා අලෙවිකරණ උපකරණ, ලාංඡන
21. ක්‍රීඩා, සෙල්ලම් බඩු, කූඩාරම් හා ක්‍රීඩා භාණ්ඩ
22. ආයුධ, තාප ලෝහ ද්‍රව්‍ය, දඩයම් , ධීවර හා කෘමිනාශක උපකරණ
23. ද්‍රව්‍ය නිශ්කාශන උපකරණ, සනීපාරක්ෂක, තාප ජනන, වාතාශ්‍රය හා වායු සමීකරණ උපකරණ, බොරතෙල්
24. වෛද්‍ය හා රසායනාගාර උපකරණ
25. ගොඩනැගිලි අංගෝපාංග හා නිමැවුම් මූලිකාංග
26. ආලෝක උපකරණ
27. දුම්කොළ හා දුම්බීම සම්බන්ධ සැපයුම්
28. ඖෂධ, විලවුන්, වැසිකිලි උපකරණ හා ද්‍රව්‍ය
29. ගිනි උවදුරු වැළකුම් හා මුදවා ගැනීමේ උපකරණ
30. සතුන් රැක බලා ගැනීම හා පාලනය කිරීම සම්බන්ධ උපකරණ
31. ආහාර හා බීම නිපදවීමට යොදා ගන්නා යන්ත්‍ර (වෙනත් කාණ්ඩයක් යටතේ ආවරණය නොවුණු)
32. වෙනත්

යාවත්කාලීන කරන ලද තොරතුරු පහත වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
*www.wipo.int/hague/en/general/classification/html*

## ඇමුණුම් අංක IV - හේග් ගිවිසුම

### කාර්මික සැලසුම් පිළිබඳ අන්තර්ජාතික ලේඛණාගාරයට අයත් හේග් ගිවිසුමේ සාමාජික රටවල්

ලක්සම්බර්ග්
බෙල්ජියම
මාලි
බෙලිස්
මොනාකෝ
බෙනින්
මොන්ගෝලියාව
බල්ගේරියාව
මොන්ටෙනග්රෝව
කෝට් ඩී අයිවරි
මොරොක්කෝ
ක්‍රොඒෂියාව
නැමිබියාව
කොරියානු මහජන සමූහාණ්ඩුව
නෙදර්ලන්තය
ඊජිප්තුව
නයිජරියාව
එස්ටෝනියාව
එක්සත් මොල්ඩෝවාව
ප්‍රංශය
රුමේනියාව
ගැබන්
සෙනෙගොලය
ජොර්ජියාව
සර්බියාව
ජර්මනිය
සිංගප්පූරුව
ග්‍රීසිය
ස්ලෝවේනියාව
හෝලි සී
ස්පාඤ්ඤය
හංගේරියාව
සුරිනෙම්
අයිස්ලන්තය
ස්විට්සර්ලන්තය
ඉන්දුනීසියාව
මැසිඩෝනියාව
ඉතාලිය
ටියුනීසියාව
කිර්ගිස්ථානය
තුර්කිය
ලැට්වියාව
යුක්රේනය
ලිච්ටෙන්ස්ටියාව

සාමාජික රටවල්: 44

බුද්ධිමය දේපල පිළිබඳ ලෝක සංවිධානය (WIPO) විසින් නිකුත් කරනු ලැබ ඇති ව්‍යාපාර සඳහා බුද්ධිමය දේපල පිළිබඳ සියළුම ප්‍රකාශන www.wipo.int/sme/en/ යන වෙබ් අඩවියෙන් ද සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශයේ විද්‍යුත් සඟරාව www.wipo.int/sme/en/documents/wipo_sme_newsletter.html යන වෙබ් අඩවියෙන් ද කිසිදු අය කිරීමකින් තොරව ලබා ගත හැකිය.

## වැඩි දුර විස්තර සඳහා


ලිපිනය :
බුද්ධිමය දේපල පිලිබඳ ලෝක සංවිධානය
නොː  34, චෙමින් ඩෙස් කොලොම්බෙට්ස්
තැ.පෙ. 18
සී එච්-1211 ජිනීවා 20
ස්විට්සර්ලන්තය

දුරකථනː
+41 22 338 91 11

ෆැක්ස් :
+41 22 733 54 28

විද්‍යුත් තැපැලː
wipo.mail@wipo.int


## නිව්යෝක් හි පිහිටි සම්බන්ධීකරණය කිරීමේ කාර්යාලය


ලිපිනයː
2, යුනයිටඩ් නේෂන් ප්ලාසා
සුයිට් 2525
නිව්යෝක්,  එන් වයි 10017
ඇමරිකා එක්සත් ජනපදය

දුරකථනː
+1 212 963 6813

ෆැක්ස් :
+1 212 963 4801

විද්‍යුත් තැපැලː
wipo@un.org

හෝ එහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය
අංශය

ලිපිනයː
නොː  34, චෙමින් ඩෙස් කොලොම්බෙට්ස්
තැ.පෙ. 18
සී එච්-1211 ජිනීවා 20
ස්විට්සර්ලන්තය

ෆැක්ස්:
+41 22 338 87 60

විද්‍යුත් තැපැලː
sme@wipo.int

වෙබ් අඩවියː
w w w.wipo.int/sme


## සිංහල පරිවර්තනය පිළිබඳ වැඩිදුර තොරතුරු හෝ ඇණවුම් කිරීම සඳහා


SMED Sri Lanka
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය
නො. 53, වොක්පෝල් පටුමග
කොළඹ 02
ශ්‍රී ලංකාව

දුරකථනː
+94 11 230 4287-9

ෆැක්ස් :
+94 11 230 4291

විද්‍යුත් තැපැලː
projsmed@slt.lk



WIPO Publication No. 498 SK/SI (සිංහල)    ISBN  978-92-805-2055-2
ප්‍රථම මුද්‍රණය



Barbara Hintermann Geneva